# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



## වාර්ෂික වාර්තාව

## 2010

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2010

# වාර්ෂික වාර්තාව

# පටුන


| විස්තරය | පිටුව |
|---|---|
| අපගේ දැක්ම | 01 |
| සංස්ථාපිත තොරතුරු | 02 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 03 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 04 - 10 |
| සභාපතිතුමාගේ වාර්තාව | 11- 18 |
| ආකලිත වටිනාකම් ප්‍රකාශය | 19 |
| මූලික කරුණු | 20 |
| සංස්ථාපිත යහපාලනය | 21 - 26 |
| මූල්‍ය ප්‍රකාශන | 27 |
| අදායම් ප්‍රකාශනය | 28 |
| ශේෂ පත්‍රය | 29 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 30 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 31 - 32 |
| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 33 - 40 |
| මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් | 41 - 54 |
| වසර 10 ක සංක්ෂිප්තය | 55 - 57 |
| විගණකාධිපති වාර්තාව | 58 - 79 |
| කෙටි යෙදුම් | 80 |

## අපගේ දර්ශනය

පාරිභෝගිකයාට මුල් තැන ලැබෙන්නා වූද පරිසර හිතකාමී වූද කලාපයේ ඛනිජ තෙල් හා ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ ව්‍යාපාරය බවට පත්වීම හා ඒ අතරම අපගේ ජාතියේ සෞභාග්‍ය උදෙසා දායකත්වය සැපයීම.

## අපගේ මෙහෙවර

ඛනිජ තෙල් පිරිපහදු කිරීම හා උසස්ම තත්ත්වයේ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ විශිෂ්ඨත්වය කරා ළඟාවීමේ අභිලාශය මුදුන්පත් කර ගැනීම සඳහා කැපවුන එම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති වෘත්තිකයන් කණ්ඩායමක් හා පක්ෂපාති, කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටුකෙරෙන පූර්ණ විසඳුම් හා සේවාවන් සැලසීම සම්බන්ධයෙන් විශිෂ්ඨත්වය සාක්ෂාත්කර ගැනීම මෙන්ම සේවක සහභාගිත්වය හා උසස් තාක්ෂණය උපයෝගි කර ගනිමින් ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා උසස්ම ආචාරධර්ම වලට අනුකූලව සෞඛ්‍ය, ප්‍රවේශම හා පාරිසරික යන අංශ කෙරෙහි ඉහළින්ම සැළකිලිමත් වෙමින් ව්‍යාපාරික හවුල් කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන්පත් කිරීම.

# සංස්ථාපිත තොරතුරු

## කළමනාකාර මණ්ඩලය

**සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ,**

මේජර් ජෙනරාල් අශෝක තෝරදෙණිය. යූඑස්පි (2010.01.01 - 2010.02.16)
කාන්ති විජේතුංග (2010.02.17 - 2010.05.12)
දේශමාන්‍ය ඩී.එච්.එස්. ජයවර්ධන (2010.05.13 සිට )

## අධ්‍යක්ෂවරු

මෙත්සිරි විජේගුණවර්ධන
එම්.ටී.අයි.වී. අමරසේකර (2010.03.17 – 2010.05.27)
සී.ඩී. අමරසේකර (2010.08.19 සිට )
ඩබ්.කේ.බී. වේරගම (2010.01.01 – 2010.04.06)
යූ.ආර්. සෙනෙවිරත්න (2010.06.24 – 2010.11.10)
එල්. ගුණවර්ධන (2010.09.06 සිට )
කාන්ති විජේතුංග (2010.11.24 සිට )
සන්ධ්‍යා විජයබණ්ඩාර (2010.11.25 සිට )
කපිතාන් නිහාල් කැප්පෙටිපොළ (2010.01.01 – 2010.01.19)
ඩී.සී. ගුණරත්න (2010.01.01. – 2010.04.29)
එම්.යූ.එම්. අලිසබ්රි (2010.07.01 – 2010.08.31)
සී. ඒකනායක (2010.07.23 සිට )

## විගණකවරු

විගණකාධිපති

## ලියාපදිංචි කාර්යාලය

" රොටුන්ඩා ගොඩනැගිල්ල" නො. 109, ගාලුපාර, කොළඹ 03.

| | | |
|---|---|---|
| දුරකථන | : | 2473644 (මාර්ග 09) 545455 (මාර්ග 10) |
| විදුලි පුවත් | : | 2473644 " ලංකා ඔයිල් " |
| විදේශ විදුලි පුවත් | : | " සිපෙට්කෝ" |
| ටෙලෙක්ස් | : | 221167, 221235, 221624, (සිපෙට්කෝ - සීඊ) |
| ෆැක්ස් | : | 2473979 |
| ඊ මේල් | : | cpcsec @ ceypetco.gov.lk |

## බැංකුකරුවෝ

මහජන බැංකුව
ලංකා බැංකුව
ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
ලංකා වාණිජ බැංකුව
සිටි බැංකුව එන්.ඒ
සී/ස හැටන් නැෂනල් බැංකුව

## ජ්‍යෙෂ්ඨ කළමනාකාර මඬුල්ල

**දේශමාන්‍ය ඩී.එච්.එස්. ජයවර්ධන**

සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ

**එන්.ආර්.ආර්. ජයසේකර**
වැඩ බලන පිරිපහදු කළමනාකාර

**ජේ.ආර්. වික්‍රමසිංහ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(සැලසුම් හා සංවර්ධන)

**ඒ.ආර්. ඒබල්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)

**එස්.ඩබ්. ගමගේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මානව සම්පත් හා පාලන)

**එන්.එන්.අයි.ආර්. ප්‍රනාන්දු**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(තාක්ෂණික සේවා)

**ආර්.ටී.ඒ. දාබරේ**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

**එන්.ආර්. අමරසිංහ**
වැ.බ. නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(මෙහෙයුම් හා නිෂ්පාදන)

**කේ.එස්.කේ. ඇටිපොල**
වැ.බ. නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(විදුලි හා උපකරණ)

**කේ.එස්.ඩබ්. කොට්ටහච්චි**
වාණිජ කළමනාකාර

**පී.පී.එච්. සමරවික්‍රම**
කළමනාකාර (ඉංජිනේරු හා පාරිශ්‍ර)

**ඩබ්. සරත් පෙරේරා**
කළමනාකාර (අභ්‍යන්තර විගණන)

**ඒ. ලැම්බියස්**
කළමනාකාර (කෘෂි රසායන)

**එච්. සෙනෙවිරත්න**
කළමනාකාර (සැපයීම්)

**සමන්ත පුෂ්පලාල් විතාන**
මානව සම්පත් කළමනාකාර

**ආර්.ඒ.කේ.සී. ආරියරත්න**
වැ.බ. ප්‍රධාන නීති නිලධාරි

**ඩබ්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ**
කළමනාකාර
(ලිහිසි තෙල් හා සම්පීඩිත දියර වායු)

**පී.එච්.එන්. සමරසිංහ**
ලේකම් අංශ ප්‍රධානී

**එච්.කේ. ගරුසිංහ**
කළමනාකාර (සංවර්ධන)

**එස්.එම්.සී.පී. සමරකෝන්**
වැඩ බලන අලෙවි කළමනාකාර (සිල්ලර)

**මේජර් එම්.ආර්.එස්.පී. සමරසිංහ**
කළමනාකාර (ආරක්ෂක/ විමර්ශන)

**ආර්.එස්. සුන්දරලිංගම්**
වැඩ බලන අතිරේක මුදල් කළමනාකාර

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වැනි වගන්තිය ප්‍රකාර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්තාවද, විගණනයට ලක්වූ මුල්‍ය ප්‍රකාශන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන් විසින් සතුටින් ඉදිරිපත් කරනු ලැබේ. කෙටුම්පත් මුල්‍ය ප්‍රකාශන 2011 ජූනි මස 30 වන දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කෙසේ වෙතත් කෙටුම්පත් මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත 2011 මැයි 11 වන දින ඉදිරිපත් කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමත කිරීමෙන් පසු මුල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලබාදී තිබේ.

වාර්ෂික වාර්තාව, විගණනය කරන ලද මුල්‍ය ප්‍රකාශන හා අදාළ ලියකියවිලි ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත දැනටමත් ඉදිරිපත් කර තිබේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ඛනිජ තෙල් ආනයනය, ශ්‍රී ලංකාව තුළ පිරිපහදු කිරීම, අලෙවි කිරීම හා බෙදාහැරීමයි.

**ආශ්‍රිත සමාගම්**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙ හී කොටස් වලින් 1/3 කට සංස්ථාව දායක වී ඇති අතර, තෙල් තොග ගබඩා කිරීම, ප්‍රවාහනය හා තොරතුරු තාක්ෂණ සේවා සැපයීම මෙම සමාගම විසින් සිදුකරනු ලබයි.

**ව්‍යාපාරික සමාලෝචනය**

සංස්ථාවේ මෙම වසර තුල කාර්ය සාධනය හා ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් අංක 11 සිට 18 දක්වා වූ පිටුවල දක්වා ඇති සභාපතිතුමාගේ සමාලෝචනයේ සඳහන් වේ.

**අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධති**

සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත්ව කරගෙන යැමටත් එහි වත්කම් සුරැකීමටත් සංස්ථාවේ වාර්තා වල නිරවද්‍යතාවය හා විශ්වාසනීයත්වය හැකිතාක් දුරට ආරක්ෂා කිරීමටත් අවශ්‍ය වන මුල්‍යමය, මෙහෙයුම් හා අවදානම් කළමනාකරනය ආවරණය වන පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සඵලදායී හා අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධති පිහිටුවා තිබේ.

**මානව සම්පත්**

සේවක නිපුනතා සංවර්ධනය කිරීමේ අරමුණින් උචිත මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති හා පරිචයන් සංස්ථාව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන අතර, මානව සම්පත් අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු නව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමේ නිරතව සිටියි.

සංස්ථාවේ අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා සේවක් මණ්ඩලයේ ප්‍රශස්ථ දායකත්වය සහතික කර ගැනීම සඳහා ඔවුනට නව අවස්ථා සැලසීම හා විදේශීය පුහුණුවීම් යනාදිය ලබාදීම සිදුකෙරේ. මෙම නව මානව සම්පත් සැලැස්ම මගින් මුළු ආයතනයේම ඵලදායිත්වය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරයි.

## විගණන කමිටුව

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. අංක PF/PE 7 හා 2000 මාර්තු 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ පැහැදිලිව නිශ්චිත කර තිබෙන විෂය ක්ෂේත්‍රය (Term of Reference) ඇතුළත විගණන කමිටුවේ විෂය පථය නිර්ණය වී තිබේ. විගණන කමිටුවේ වගකීම හා කාර්ය ක්‍ෂේත්‍රය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විගණන ප්‍රඥප්තියේ (audit charter) දක්වා තිබේ.

## මූල්‍යමය කාර්ය සාධනය

## පිරිවැටුම

මෙම වසරේ පිරිවැටුම රුපියල් බිලියන 256.329 දක්වා වැඩි වූ අතර, ඊහා සාපේක්‍ෂව 2009 වසරේ පිරිවැටුම රුපියල් බිලියන 237.622 ක් විය. මෙය පෙර වසර හා සසඳන විට 7.85 % ක වර්ධනයකි.

සංස්ථාවේ මුළු පිරිවැටුමෙන් 95.4 % ක් දේශිය විකුණුම් වලින් සමන්විත වන අතර, චක්‍ර අපනයන වලින් 4.6% ක දායකත්වයක් ලබා තිබේ. දේශිය පිරිවැටුම තුළ ප්‍රධාන අගයක් ගන්නා ඛනිජ තෙල් නිෂ්පාදන ලෙස ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, ලංකා දැවිතෙල් වල විකුණුම් අගයන් නියෝජනය වේ.

## ලාභය/ අලාභය

සංස්ථාව සමලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 26,922.82 ක අලාභයක් දැරීය. මෙම මූල්‍ය අලාභය කෙරෙහි බලපාන ලද ප්‍රධානතම සාධකයන් වනුයේ, ලෝක වෙළඳපලෙහි තෙල් මිල ගණන් වලට සාපේක්‍ෂව දේශිය වෙළඳපලෙහි තෙල් මිල ගණන් කාලීනව සංශෝධනය නොකිරීමත්, ලංකා විදුලි බල මණ්ඩලයට හා පෞද්ගලික විදුලි බල නිෂ්පාදකයන් වෙත සහනාධාර මිලක් යටතේ ඩීසල්, දැවිතෙල් අලෙවි කිරීමත් හා භූමිතෙල් හා ඩීසල් දේශිය වෙළඳපලේ සහනාධාර මිලකට අලෙවි කිරීමත්ය.

විදුලිබල උත්පාදනය සඳහා යොදා ගන්නා දැවිතෙල් 1500, (සල්ෆර් ඉහළ අගයක් ගන්නා) දැවිතෙල් 1500, (සල්ෆර් පහළ අගයක් ගන්නා) දැවිතෙල් 3500, (සල්ෆර් ඉහළ අගයක් ගන්නා දැවිතෙල්) හා නැප්තා සහන මිලකට සැපයීම හේතුවෙන් සංස්ථාව සමාලෝචිත වර්ෂයේ ලැබූ පාඩුව රුපියල් මිලියන 23,958 කි. එසේම, ඩීසල් හා භූමිතෙල් සහන මිලට සැපයීම නිසා ලැබූ පාඩුව පිළිවෙලින් රුපියල් මිලියන 4,676 ක් සහ රුපියල් මිලියන 4,295 ක් විය. ගුවන්යානා දැවිතෙල් සහන මිලට සැපයීම හේතුවෙන් ලැබූ පාඩුව රුපියල් මිලියන 531 ක් විය.

**අංශාත්මක වශයෙන් 2010 දරන ලද පාඩුවේ විස්තර පහත දැක්වේ.**

| අංශය | පාඩුව රු. මිලියන |
|---|---|
| ප්‍රවාහන අංශය - ඩීසල් සහන මිලට සැපයීම | 4,676 |
| විදුලිබල උත්පාදනය - නැප්තා හා දැවිතෙල් සහන මිලට සැපයීම (1500 H/S, 3500 H/S, 1500 L/S) | 20,217 |
| ගුවන්යානා තෙල් සැපයීම - ගුවන්යානා තෙල් සහන මිලට සැපයීම | 531 |
| කර්මාන්ත අංශය - දැවිතෙල් හා භූමිතෙල් සහන මිලට සැපයීම | 8,036 |
| ගෘහස්ථ අංශය - LPG සහන මිලට සැපයීම | 103 |
| ගොවිජන කොට්ඨාශ - කෘෂි රසායන සහන මිලට සැපයීම | 30 |
| අපනයන අංශය - නැප්තා හා දැවිතෙල් අලෙවිය | 129 |

සමාලෝචිත වර්ෂයේ සුවිශාල අලාභය ඇතිවීම කෙරෙහි ඉහත සාධක බලපෑවද ඔක්ටේන් 90 සහ ඔක්ටේන් 95 වර්ග වල පෙට්‍රල්, සුපර් ඩීසල්, තාර, ලිහිසි තෙල්, අලෙවි කිරීම හා සංස්ථාව අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද අදායම් හා ලාභ, සමස්ථ අලාභය රුපියල් මිලියන 26,922.819 කට සීමා කිරීමට සමත් විය.

**විස්තරාත්මක වශයෙන් ශුද්ධ ලාභය/ (අලාභය) පහත පරිදි වේ**

| | 2010<br>රු. මිලියන | 2009<br>රු. මිලියන |
|---|---|---|
| අදායම | 256,329.157 | 237,622.619 |
| විකුණුම් පිරිවැය | (265,603.764) | (233,540.920) |
| දළ ලාභය | (9,274.607) | 4,121.700 |
| මෙහෙයුම් ආදායම් (මූල්‍ය හා වෙනත්) | 532.847 | 2,290.064 |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | (8,741.760) | 6,411.764 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | (9,716.083) | (10,421.438) |
| පරිපාලන වියදම් | (1,606.078) | (2,602.887) |
| මූලය වියදම් | (6,858.899) | (4,740.663) |
| බදු පෙර ලාභය/ (අලාභය) | (26,922.819) | (11,353.224) |
| බදු | -- | (213.733) |
| **බදු පසු ලාභය/ (අලාභය)** | **(26,922.819)** | **(11,566.957)** |

## රජය වෙනුවෙන් කරන ලද දායකත්වය

| | 2010<br>රු. මිලියන | 2009<br>රු. මිලියන |
|---|---|---|
| එකතු කළ අගය මත බදු | 7,789 | 9,007 |
| නිෂ්පාදන බදු | 18,579 | 17,864 |
| සමාජ වගකීම් බද්ද | 269 | 461 |
| බෙදුම්කරු පිරිවැටුම් බදු හා ආනයන පිරිවැටුම් බදු | 2,776 | 2,248 |
| ගුවන් තොටුපළ හා වරාය බද්ද | 8,353 | 5,783 |
| රේගු බදු | 1,246 | 18,341 |
| භර බද්ද | 262 | 125 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 95 | 166 |
| **එකතුව** | **39,369** | **53,995** |

### මෙහෙයුම් වියදම්

පෙර වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 17,764.99 ක මෙහෙයුම් වියදම් සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 18,173.06 ක් දක්වා ඉහළ ගියේය. පෙර වර්ෂයට සාපේක්ෂව මෙහි වර්ධනයේ ප්‍රතිශතාත්මක අගය 2.34% කි.

### ප්‍රාග්ධන වියදම්

2009 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 270.642 කට සාපේක්ෂව මෙම වර්ෂයේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 347.596 ක් විය.

### දේපළ පිරියත හා උපකරණ

සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ වල වෙනස්වීම් හි විස්තරාත්මක ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශ සටහන් දක්වා ඇති 47 වන පිටුවේ, අංක 6 සටහනින් දක්වා ඇත.

### සංචිත

2009 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 13,038.05 ක ඍණ ස්කන්ධ තත්ත්වය 2010 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 39,951.63 දක්වා පිරීහි තිබේ. 2008 වසරේ සිට සංස්ථාව ලැබූ සමුච්චිත අලාභ තත්වයන් මෙම හිමිකරු ප්‍රාග්ධන සංචිතයන් ඍණ තත්වයක් දක්වා පිරීහිම කෙරෙහි බලපා තිබේ. මේවායේ චලනයන් පිළිබඳව වැඩි දුරටත් පිටු අංක 30 හි, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

### දායක ප්‍රාග්ධනය

2009 දෙසැම්බර් මස 31 දිනට සංස්ථාවේ දායක ප්‍රාග්ධනය රුපියල් මිලියන 1,000 ක් විය.

**අධ්‍යක්‍ෂක මණ්ඩලය**

සභාපති තුමාද ඇතුලත්ව අධ්‍යක්‍ෂ මණ්ඩලය සාමාජිකයන් 7 දෙනකුගෙන් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත පරිදි වේ.

1. දේශමාන්‍ය ඩී.එච්.එස්. ජයවර්ධන මහතා - සභාපති/ කළමනාකාර අධ්‍යක්‍ෂක
2. සන්ධ්‍යා විජයබණ්ඩාර මහත්මිය
3. මෙත්සිරි ඩී. විජේගුණවර්ධන මහතා
4. චම්පිකා දිල්හාරා අමරසේකර මිය
5. චේතිය ඒකනායක මහතා
6. ලක්‍ෂ්මන් ගුණවර්ධන මහතා
7. කාන්ති විජේතුංග මිය

**සම්බන්ධිත පාර්ශවයන් සමග අධ්‍යක්‍ෂ වරුන්ගේ ඇල්ම**

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අධ්‍යක්‍ෂ වරුන්වන මෙත්සිරි විජේගුණවර්ධන මහතා සහ චේතිය ඒකනායක මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ හී අධ්‍යක්‍ෂ වරුන් ලෙස ක්‍රියාකළ අතර, සංස්ථා අධ්‍යක්‍ෂිකා සන්ධ්‍යා විජයබණ්ඩාර මහත්මිය 2010.07.01 දින සිට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්‍ෂවරියක ලෙස පත් කෙරිණ.

**නීති හා රෙගුලාසි සමග අනුකූලත්වය**

නීති හා රෙගුලාසි උල්ලංඝණය වන කිසිදු ආකාරයක ක්‍රියාකාරකමක සංස්ථාව යෙදී නොමැත. විවිධ නීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූලත්වය සහතික වීම පිණිස වගකිව යුතු සියල්ලෝම සිය අනුකූලත්වය අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත සනාථ කොට තිබේ.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්‍ෂවරුන්ගේ දැනීමේ හා විශ්වාසය හැටියට ශ්‍රී ලංකාණ්ඩුව හා සේවකයන් සම්බන්ධයෙන් වන ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ල නියමිත කාලයට පියවා තිබේ.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් වල බලපෑම**

ශේෂ පත්‍ර දිනට හෙජින් ගනුදෙනුව සම්බන්ධව නඩු නිමිති දෙකක් පැවති අතර, ඒවායේ තත්ත්වය පහත දැක්වේ.

**(i) සිටි බැංකුවට එරෙහිව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පවරන ලද ලන්ඩන් සමථකරණ නඩුව**

2007 ජුලි හා 2008 ජුලි මාස වල හෙජින් ගිවිසුමට අදාලව ප්‍රධාන ගනුදෙනු දෙකක් සම්බන්ධව සිටි බැංකුව සංස්ථාවෙන් වන්දි ඉල්ලා ඉහත සමථ මණ්ඩලයේ නඩු පවරා තිබිණ. ඇ.එ.ජ. ඩොලර් 195,458,092.67 හා එයට අදාල වන පොලිය සිටි බැංකුව විසින් සංස්ථාවෙන් ඉල්ලා තිබිනි.

2011.07.31 දිනට සමථ බේරුම්කරණ මණ්ඩලය විසින් තම තීරණය ප්‍රකාශයට පත්කර තිබිණ. ඒ අනුව, 2007.07.11 දින සිට 2008.07.16 දින දක්වා හෙජින් ගනුදෙනුවට අදාල අංක 1 සිට 16 දක්වා ගනුදෙනු බලරහිත අධිකාරී බලය ඉක්මවා සංස්ථාව ගත් තීරණ ලෙස සළකා විනිශ්චයක් දී තිබේ.

ඒ අනුව, සිටි බැංකුවට සංස්ථාව ඇ.එ.ජ. ඩොලර් 17,926,300 හා අදාළ පොළිය සමග ගෙවීමට තිබිණ. සිටි බැංකුව සංස්ථාවට ඇ.එ.ජ. ඩොලර් 16,723,750 ක් හා ඊට අදාල පොළිය සමග ගෙවීමට තිබිණ.

ඒ අනුව, සංස්ථාව විසින් සිටි බැංකුවට ගෙවිය යුතු ශුද්ධ අගය වනුයේ ඇ.එ.ජ. ඩොලර්1,202,550 කි. පාර්ශවයන් දෙකම ඒ ඒ අවස්ථාවල ගෙවන ලද මුදල් නැවත ආපසු ගෙවීමේ දිනය දක්වා පොළි මුදල් ලැබීමට හිමිකමක් ඇත යන පදනම මත පොළි ගණනය කිරීමට එකඟත්වයක් ඇති විය.

2011.11.21 දිනට සිටි බැංකුවෙන් ලැබිය යුතු පොළි මුදල් හිලවු කිරීමෙන් පසු සංස්ථාව විසින් සිටි බැංකුවට පොළි වශයෙන් ඇ.එ.ජ. ඩොලර් 164,168.29 ක් ගෙවීමට තිබිණ. ඒ අනුව, සිටි බැංකුවට ගෙවිය යුතු මුලු මුදල ඇ.එ.ජ. ඩොලර් 1,366,718.29 (1,202,550 + 164,168.29) කි. සමථ බේරුම්කරණ මණ්ඩලය විසින් 2011.12.15 වන දින දෙන ලද අවසාන තීරණය ප්‍රකාරව සංස්ථාවට, සිටි බැංකුවෙන් නීති වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙස ඇ.එ.ජ. ඩොලර් 2,705,760.43 ලැබිණ. ඒ අනුව, සංස්ථාවට ඇ.එ.ජ. ඩොලර් 1,339,042.14 ක් (රුපියල් 153,458,915.90) ශුද්ධ ලැබීමක් ලෙස සිටි බැංකුවෙන් ලැබිණ.

**(ii) ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවට එරෙහිව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

2008.05.28 දින හා 2008.07.09 වන දින ප්‍රධාන හෙජින් ගිවිසුම යටතේ ගනුදෙනු අංක 8 සහ 9 ට අදාලව ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ඇති කර ගත් ගනුදෙනු වලට අදාලව ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව ඇ.එ.ජ. ඩොලර් 161,733,500 හා ඊට අදාල පොළිය වන්දි වශයෙන් ඉල්ලා තිබිණ.

සංස්ථාව මෙම වන්දියට එරෙහිව විවිධ කරුණු යටතේ ප්‍රතිවිරෝධතා ගොනුකර තිබිණ. අධිකරණයේ තීන්දුව වූයේ ගනුදෙනු අංක 8 හා 9 සම්බන්ධව සංස්ථාවේ ඉල්ලීම ඉවතලා ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවේ ඉල්ලීම පිළිගත් බවයි. ඒ අනුව, ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවට ඇ.එ.ජ. ඩොලර් 166,476,281.77 හා 50% ක් නීති වියදම් ලෙස සළකනු ලබන බ්‍රිතාන්‍ය පවුම් 2,963,546.02 මුදලක් ගෙවන ලෙස විනිශ්චයක් ලබාදී තිබිණ.

මෙම තීරණයට එරෙහිව ඇපෑලක් ගොනුකල අතර, ඇපෑල් උසාවිය විසින් වාණිජ මහ අධිකරණය විසින් ගෙන තිබූ තීරණය ස්ථිර කර තිබිණ. ඒ අනුව, සංස්ථාව විසින් ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුවට ඇ.එ.ජ. ඩොලර් 166,476,281.77 හා 50% වූ නීති වියදම් ගෙවීමට නියම කෙරිණ.

මෙම තීරණයට එරෙහිව බ්‍රිතාන්‍යයේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නීතිපති තුමාගේ උපදෙස් අනුව සංස්ථාව ඇපෑලක් ගොනුකර තිබේ.

ගරු නීතිපති තුමා ඉහත සඳහන් නඩු නිමිති දෙක සඳහා සංස්ථාව වෙනුවෙන් අවශ්‍ය නීති උපදෙස් හා නියෝජනයන් ලබා දුනි.

**අඛණ්ඩ පැවැත්ම**

සංස්ථාවේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලද අතර, අපේක්‍ෂිත මට්ටමින් අනාගතයේ දී සිය මෙහෙයුම් නොකඩවා කරගෙන යෑමට තරම් ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතු බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. කෙසේ වෙතත් විගණකාධිපතිවරයා සිය වාර්තාවෙන් දක්වා ඇත්තේ සංස්ථාවේ ශේෂ පත්‍ර දිනට පවතින ඍණ ස්කන්ධ තත්ත්වය රු. මිලියන 39,952 ක් වන හෙයින් ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් මූල්‍ය ආයතන වලින් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව සැකයක් ඇතිවන බවයි.

**අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය හා අනුකූලත්වය**

ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හා ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ පාලන ක්‍රමෝපායන් පවත්වාගෙන යමින් සංස්ථාවේ වත්කම් ආරක්‍ෂා කර ගනිමින් ප්‍රමාණවත් පරිදි පාලන පද්ධතියක් පවත්වාගෙන යමින් වංචා වැරදි හා අක්‍රමිකතා වලක්වමින් කටයුතු කරගෙන යාමට අධ්‍යක්‍ෂ මණ්ඩලය පියවර ගෙන තිබේ. එසේම, ආවේණික අවදානම් මුලුමනින්ම වලක්වාගැනීමට නොහැකි වුවත් ඒවා අවම කිරීම සඳහා උචිත යටිතල පහසුකම්, පාලන පද්ධතීන් හා ආචාර ධර්ම හැසිරීම් පද්ධතීන් හඳුන්වා දෙමින් ඒ අනුව කලින් නිර්ණය කරන ලද පිළිවෙත් වලට අනුව කටයුතු කිරීමට සංස්ථාව උත්සාහ දරයි. අධ්‍යක්‍ෂ මණ්ඩලය හා කළමනාකරණය අවධානම් කළමනාකරණ පිළිවෙත් හා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා තිබේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව අවදානම් කළමනාකරණයට පාදක වන ප්‍රධාන කරුණු වලට අවශ්‍ය පියවර ගැනීම සඳහා ස්ථාපිත කර තිබේ.

**යහපාලනය**

ක්‍රියාකාරී යහපාලන ව්‍යුහයක් හා ක්‍රමෝපායන පද්ධතීන් පවත්වාගෙන යාමට අධ්‍යක්‍ෂ මණ්ඩලය බැඳී සිටියි. යහපාලන පරිචයන් සංස්ථාවේ මූල්‍ය මෙහෙයුම් හා බලාත්මක ක්ෂේත්‍ර වල ක්‍රියාත්මක වේ. මෙම යහපාලන පරිචයන් යහපාලන පද්ධතීන් වලට අනුකූලවේ. එවැනි යහපාලන උපක්‍රම පිළිබඳ විස්තරයක් පිටු අංක 21 හී යහපාලන වාර්තාවේ දක්වා තිබේ.

**විගණකයින් පත්කිරීම**

සංස්ථාවේ විගණක වනුයේ විගණකාධිපති වරයාය. ඔහු පත් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේය. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපති වාර්තාව පිටු අංක 58 යටතේ මෙම වාර්ෂික වාර්තාවට ඇතුලත් කොට ඇත.

අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙනුවෙන්,



**ජ්‍යේශමාන්‍ය බී.එච්.එස්. ජයවර්ධන**
සභාපති/ කළමනාකාර අධ්‍යක්‍ෂක
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# සභාපති වාර්තාව

**හැඳින්වීම**

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන්ට අනුව ශ්‍රී ලාංකීය ආර්ථිකය, 2010 වර්ෂයේ සමස්ථ වර්ධන වේගය 8% ක් බවත්, 2009 වසරේ පැතිර පැවති අයහපත් තත්වයන් ආපස්සට හරවමින් ආර්ථිකය උසස් හා තිරසාර වර්ධන මාර්ගයන්ට පිවිස ඇතයි වාර්තා කර තිබේ.

පෙර වර්ෂය හා සසඳන විට අන්තර් ජාතික වෙළඳපලේ බොරතෙල් මිල 2009 පැවති අවම මිලයට වඩා, 2010 වර්ෂයේ දී ඉතා ඉහළ අගයක් විය. 2010 වර්ෂයේ අන්තර් ජාතික වෙළඳපලේ බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඉහළ යාම ඇ.එ.ජ. ඩොලර් 80 ක් වූ අතර, එය 2009 වර්ෂයේ දී ඇ.එ.ජ. ඩොලර් 62 ක් විය. මෙය 29% ක වාර්තාගත ඉහළයාමකි. 2010 වර්ෂය අවසානය වන විට ලෝක වෙළඳපලෙහි පැවති අධි ඉල්ලුම හේතුවෙන් මෙය ඇ.එ.ජ. ඩොලර් 92 දක්වා ඉහළ යාමත් තෙල් නිපදවන රටවල පැවති දේශපාලනික හා භූගෝලීය අස්ථාවරත්වයත් මෙම තත්වයට විශාල වශයෙන් හේතු විය.

2010 වර්ෂයේ දී සංස්ථාව විසින් ආනයනය කරන ලද බොරතෙල් සඳහා සාමාන්‍ය පිරිවැය හා ප්‍රවාහන කුලී 24.4% කින් ඉහළ ගිය අතර, එය බැරලයට ඇ.එ.ජ. ඩොලර් 79.52 විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ දේශීය වෙළඳපලේ ඛනිජ තෙල් සිල්ලර මිලගණන් සංශෝධනය නොකළ අතර, 2009 දෙසැම්බර් මස සිට පැවති මිල ගණන් මත දේශීය වෙළඳපලේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි විය.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ඉහළ දැමීම පිණිස ගනු ලැබූ වැදගත් ක්‍රියාමාර්ග**

01. තෙල් කලවම් කිරීම් හා ඉන්ධන නිකුතු මනු වෙනස් කිරීම් සම්බන්ධයෙන් දිවයින පුරා පිහිටි ඉන්ධනහල් විමර්ශන කටයුතු සංස්ථාව විසින් දැඩි කරන්නට විය. විශාල ප්‍රමාණයක බෙදුම්කරුවන් ප්‍රමාණයක් මෙම විමර්ශන කටයුතු නතර කරවීමට දැඩි පීඩනයක් එල්ල කළ ද, සංස්ථාව මේ පිළිබඳ විමර්ශන කටයුතු නොකඩා පවත්වාගෙන ගිය අතර, මෙමගින් තෙල් බාල කිරීම් හා මනු වෙනස් කිරීම් සැළකිය යුතු ලෙස අඩු කිරීමට හැකි විය. ආරක්ෂක අමාත්‍යංශයේ සහයෝගය ඇතිව ජාවාරම් කරුවන්ගෙන් වන විනාශය වලක්වා ගනු පිණිස හා ඔවුන් සමඟ ගණුදෙනු කරන කූට බෙදුම්කරුවන් පිළිබඳ වැටලීම් දැඩි කළ අතර, එමගින් අපිරිසිදු තෙල් වෙළඳපළට විශාල වශයෙන් නිකුත් කිරීම අවම කිරීමට හැකි විය. මෙම ජාවාරම වසර ගණනාවක සිට ක්‍රියාත්මක වී තිබූ අතර, සම්මත පිරිවිතරයන්ට අනුකූලව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද ඉන්ධන ඇතැම් බෙදාහැරීම් මධ්‍යස්ථාන වලින් තත්ත්වය බාල කොට පාරිභෝගිකයනට ලබාදී ඇති බව වාර්තා විය. මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මාගේ විශේෂ ස්තුතිය ආරක්ෂක ලේකම්වරයාට පුද කරන අතර, අකටයුත්තක් සිදු නොකල හැකි ආකාරයකට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඛනිජතෙල් නිෂ්පාදන ලංකා ඛනිජ තෙල් සංස්ථා නීති රීති වලට අනුකූලව බෙදාහැරීමට සහයෝගය ලබා දීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය වෙතද මාගේ විශේෂ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

02. චීනයෙන් ආනයනය කරන ලද ඉන්ධන නිකුතු පොම්ප සංස්ථා පිරිවිතරයනට අනුකූල නොවන හා ඉතා පහසුවෙන් වෙනස් කිරීමේ හැකියාව පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පිරවුම්හල් වල පැවති බොහෝමයක් ඉන්ධන නිකුතු පොම්ප දෝෂ සහිත ඒවා වූ අතර, පාරිභෝගිකයනට නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉන්ධන නිකුත් කරන බවට පැමිණිලි ලැබිණ. පිරවුම්හල් වෙත ලබා දී තිබූ දේශීයව නිපදනව ලද අමතර කොටස් වෙනුවට, ඉන්ධන නිකුතු පොම්ප නිෂ්පාදකයන්ගෙන් නියම අමතර කොටස් ආනයනය කොට බෙදාහැරීමට සළසා සියලුම දෝෂ සහිත පොම්ප අළුත්වැඩියා කොට දිවයින පුරා පාරිභෝගිකයන් හට ඉතා ඉහළ සේවාවක් ලබා දීමට අපට හැකි විය.

03. සංස්ථාව සියළුම බැංකු සමග සාකච්ජා කොට වාණිජ කටයුතු වලදී අයකරන ඉතා ඉහළ පොළී අනුපාතිකයන් අඩුකර, වෙළඳපලේ අනෙකුත් ගැනුම්කරුවන්ට දෙනු ලබන පවතින පොළී අනුපාතිකය යටතේ ණය ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැණින. මෙමඟින් මිලියන් ගණනක පොළී මුදල් ඉතිරිකර ගැනිමට හැකිවිය.

04. සංස්ථා ඉතිහාසයේ මුල් වතාවට සියළුම බැංකු විසින් ඉදිරිපත් කරන විනිමය අනුපාත සහ දෛනික පදනම මත විමසීම් සිදුකිරිම සලකා බලා බැංකු ක්‍රමය තුළින් මිල ගණන් ඉදිරිපත් කරනු ලබන විනිමය අනුපාතයට නොව වෙළඳපළ හැසිරීමට අනුව තිරණය වන විනිමය අනුපාතිකයට ඩොලර් මිලදී ගැනිමක් ක්‍රියාත්මක කෙරිණ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රතිලාභයක් ලබාගැනිමට හැකි විය.

05. සංස්ථාව පිරිවිතරයන්ට අනුකුල නොවන ආනයනික නැව්ගත තොග ප්‍රතික්ෂේප කිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, ඇතම් සැපයුම්කරුවන්ගේ අවිධිමත් ක්‍රියාවන්, වැරදි වැඩ, පැහැර හැරීම් වෙනුවෙන් විශාල දඩ මුදල් පැවරීම සිදුකෙරිණි. නැව් කුලී ගිවිසුම් වල අන්තර්ගත කොට ඇති වගන්තින් පිළිබඳ අවබෝධයක් සංස්ථාවට නොමැතිකම හේතුවෙන් අතිරේක වශයෙන් සංස්ථාවට නැව් සමාගම් වලින් ලැබිය යුතු මුදල් පිළිබඳ අවශ්‍ය හිමිකම් ඉල්ලීමට ක්‍රියා කෙරිණ. මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ විශාල ප්‍රමාද ගාස්තුවක් සංස්ථාවට ඉතිරි කර ගැනිමට හැකිවිය. එසේම ප්‍රවර්ථන වර්ෂයේ දි නැව් ගාස්තු සැළකිය යුතු අන්දමින් පහළට ගෙන ඒමට හැකිවිය. මෙම මෙහෙයුම හේතුවෙන් වර්තමානයේ හා අතිතයේ රුපියල් බිලියනයකට වඩා වැඩි ඉතිරියක් කර ගැනිමට ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවට හැකි විය.

06. මූල්‍ය, නීති, පරිපාලන හා අලෙවි කාර්යාංශයන් සඳහා වෘත්තිය සුදුසුකම් හා මනා හැකියාවක්, පළපුරුදු සහිත කළමනාකරුවන් බඳවා ගැනීම තුළින් සංස්ථාවේ මූල්‍ය හා මෙහෙයුම් හැකියාවන් ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, වාණිජමය පදනමකින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු ඉදිරියට කරගෙන යාමට හැකි විය.

07. ලංකා ඛනිජතෙල් නිතිගත සංස්ථාවට එරෙහිව පවරා තිබූ සියළුම නඩු ඉතා විමසිල්ලෙන් අධීක්ෂණය කරන ලද අතර, පසුගිය කාලය තුළ අවාසිදායක ලෙස නිමාවූ නඩු සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදි. නීතිපති දෙපාර්තමේන්තුව හා අපගේ නීති නිලධාරීන් එක්ව ශක්තිමත් ක්‍රමවේදයකින් සියළුම නඩු වෙනුවෙන් පෙනී සිටිමින් විශාල සාර්ථකත්වයක් අත්කර ගැනිමට සමාලෝචිත වර්ෂයේදී හැකි විය.

08. සමාලෝචිත වර්ෂය තුළ අවම බිඳ වැටුම් තත්ත්වයක් පවත්වා ගනිමින් සතුටුදායක මට්ටමින් අඛණ්ඩව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට පිරිපහදු කළමනාකරුට හැකි විය. යන්ත්‍රාගාර නඩත්තු වැඩසටහන්, තඩාග පිරිසිදු කිරීම හා ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා ධාරිතාවයන් වර්ධනය කිරීම යනාදිය සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ ආනයන වියදමක් දරමින් නිමි තොග ආනයන පිරිවැයට සාපේක්ෂව අඩු පිරිවැයකින් ඉන්ධන ලබාදීමට ගතවූ වර්ෂය තුළදී හැකිවිය.

09. ඉන්ධන ගබඩා කිරීමට භාවිතා කරනු ලබන ටැංකි වසර ගණනාවක සිට අලුත්වැඩියා නොකර පැවති අතර (විශේෂයෙන් බොරතෙල් ටැංකි) ඒවායේ ගබඩා කිරීමේ පහසුකම් වර්ධනය කිරීමේ අරමුණින් ටෙන්ඩර් කැඳවා සුදුසු සමාගම් වලට ප්‍රදානය කිරීමට සමාලෝචිත වර්ෂයේ දී පියවර ගැනිණ.

10. මාගේ සේවා කාලය තුළ ලද විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැක්කේ රජයේ ප්‍රධාන වාණිජ බැංකු දෙක ඛනිජ තෙල් ආනයන බිල්පත් පියවීමට අපහසු වූ අවස්ථාවක මා අධ්‍යක්‍ෂක ලෙස ක්‍රියාකරන පුද්ගලික බැංකුවකින් අ.එ.ජ. ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ලබා ගැනීමට හැකි විමයි. මෙම පියවර නොගත්තේ නම් කිසිම ආයතනයක් සංස්ථාවට ණය පහසුකම් ලබානොදීමට ඉඩකඩ තිබිණි. එසේම, මෙලෙස ක්‍රියාකිරීම හේතුවෙන් අනාගත ණය පහසුකම් ලබාගැනීමටත්, සංස්ථාව බුන්වත්වීමට ඇතිවූ අවකාශයෙන් බේරාගැනීමටත් හැකි විය.

11. සංස්ථා පිරිවිතරයනට අනුකූලව නොවූ අපේක්‍ෂිත මට්ටමට නොමැති ඉන්ධන නිකුතු පොම්ප සැපයූ නිෂ්පාදකයන් දෙදෙනාගෙන් වන්දි ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. මෙම සැපයුම්කරුවන්ගේ බැංකු ඇපකර අත්හිටුවීම නිසා අවශ්‍ය අමතර කොටස් නොමිලයේම ලබාගැනීමට සංස්ථාවට හැකිවූ අතර, මෙමඟින් විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරිකර ගැනීමට සංස්ථාවට හැකි විය.

12. උතුරු හා නැගෙනහිර පළාත් වලට සාමය උදාවීමත් සමඟ "උතුරු වසන්තය" හා "නැගෙනහිර උදානය" වැඩසටහන යටතේ විශාල පිරවුම්හල් ප්‍රමාණයක් ගොඩනැංවීමට හැකි විය. මෙම ක්‍රියාවලිය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පාරිභෝගිකයන්ට කෙලින්ම පිරවුම්හල් වලින්ම නියම තත්ත්වයෙන් යුතු ඉන්ධන ලබාගැනීමට හැකි වේ. ප්‍රවාහන වියදම් අවම කර ගනිමින් මහා මාර්ග හා දුම්රිය මගින් මෙම ප්‍රදේශ වලට ඉන්ධන බෙදාහරිනු ලබන අතර, මෙමගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් ලබාගැනීමට හැකියාව ලැබිණ.

13. විවිධ වට්ටම්, ප්‍රවාහන ප්‍රතිපාදනයන් හා අතිරේක සැතපුම් ගණන සලකා ලබා දුන් ඉන්ධන ප්‍රවාහන වියදම් ක්‍රම අහෝසිකොට වෙළඳපළ නිර්ණයන් පදනම් කරගත්, සංස්ථාවට ප්‍රතිලාභයක් අත්වන පරිදි ප්‍රවාහන දීමනාව සංශෝධනය කරන ලදී.

14. අළුතින් පිහිටුවන ලද පිරවුම්හල් සංස්ථාවේ පිළිගත් ක්‍රමවේදයට අනුකූලව ක්‍රියාත්මක වන්නේ දැයි නිතරම අධීක්‍ෂණ කරනු ලබයි. එසේ සංස්ථාවේ පිළිගත් පිරිවිතරයන් හා ක්‍රමවේදයට අනුකූලව නොවන පිරවුම්හල් පවරා ගැනීමට කටයුතු කරනු ලබයි.

15. විශාල ලෙස ලැබිය යුතු ණය සහ දිගු කාලීනව ගෙවීම් පැහැර හැර තිබූ අය කිරීමට අපහසුව තිබූ ණය, අන්‍යෝන්‍ය අවබෝධය මත වාරික පදනමින් සංස්ථාවට නැවත අයකර ගැනීමට හැකිවන සේ පහසුකම් සලස්වන ලදී. මෙම ණය අපගේ ගිණුම් සටහන් වල අඩමාණ ණය ලෙස

වර්ගීකරණය කරන ලදී. මෙම එකඟතාවය මත රුපියල් මිලියන 250 කට වැඩි මුදලක් සමාලෝචිත වසරේ එකතු කර ගැනීමට සංස්ථාවට හැකිවිය.

16. ඉහත ක්‍රමයම අනුගමනය කරමින් වෙළඳ ණයගැතියන් ගෙවීම් ප්‍රමාද කිරීම නිසා අයකර ගැනීමට නොහැකි වූ පොළී මුදල් එකතු කරගැනීමේ ක්‍රියාමාර්ගයන්ද සංස්ථාව අනුගමනය කළ අතර, එමගින් 2010 වසර තුළ රුපියල් මිලියන 820 ක් එකතු කර ගැනීමට හැකි විය.

17. හම්බන්තොට අන්තර් ජාතික ගුවන් තොටුපල (මත්තල) සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් යෝජිත ගුවන්යානා තෙල් සැපයීමේ අංගනයකට හා හයිඩ්‍රන්ට් (නල පද්ධතියකට) පද්ධතියක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම සිදුකරනු ලැබීය.

**මූල්‍ය කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සමස්ථ අලාභය රුපියල් මිලියන 26,922.819 ක් විය. මෙම අලාභය සඳහා හේතු වූ ප්‍රධානතම සාධකයන් අතර වර්ෂය පුරාවට පැතිර පැවති අන්තර් ජාතික තෙල් මිල ගණන් වලට සාපේක්ෂව දේශීය වෙළඳපළ මිලගණන් කාලීනව සංශෝධනය නොකිරීම, ලංකා විදුලි බල මණ්ඩලය වෙත හා පෞද්ගලික විදුලි බල නිෂ්පාදකයන් වෙත සහනදායී මිලකට දැවිතෙල් අලෙවි කිරීම හා භූමිතෙල් වෙනුවෙන් සහනාධාර ප්‍රදානය කිරීම හේතු විය.

ප්‍රවාහන අංශය සඳහා ඩීසල් සහනාධාර මිලට සැපයීමක් හේතුවෙන් සංස්ථාව රුපියල් මිලියන 4,676 ක අලාභයක් ද විදුලි බල උත්පාදනය සඳහා අධි සල්ෆර් දැවිතෙල් වර්ග දෙක (3500,1500) සහනාධාර මිලට අලෙවියෙන් ලැබූ පාඩුව පිළිවෙලින් රු. මිලියන 19.695 ක් වන අතර, අඩු සල්ෆර් අගයක් ඇති දැවිතෙල් අලෙවියෙන් ලැබූ පාඩුව රු. මිලියන 25.839 කි. එසේම, නැප්තා විදුලිබල නිෂ්පාදනය සඳහා සහන මිලට සැපයීමෙන් ලැබූ පාඩුව රුපියල් මිලියන 495.813 කි. ගුවන් සමාගම් වෙත ගුවන්යානා ඉන්ධන සැපයීම වෙනුවන් සංස්ථාව සමාලෝචිත වර්ෂයේ ලැබූ පාඩුව රු. මිලියන 531.736 කි. විවිධ කර්මාන්ත සඳහා අධි සල්ෆර් දැවිතෙල් (1500, 800) සැපයීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 3,741 ක අලාභයක් දැරීය. එසේම, පාරිභෝගිකයන් වෙත සහනාධාර මිලට භූමිතෙල් සැපයීමෙන් ලැබූ පාඩුව රු. මිලියන 4,295.446 කි. එමෙන්ම, සම්පීඩිත දියර වායු විකිණීමෙන් ලද පාඩුව රු. මිලියන 102.675 කි. කෘෂි රසායන අංශය සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 30.440 ක පාඩුවක් ලැබීය.

කෙසේ වෙතත් පෙට්‍රල්, ලංකා සුපර් ඩීසල් හා ඩීසල්, තාර, ලිහිසිතෙල් අලෙවියෙන් ලැබූ ලාභ සහ අනෙකුත් ආදායම් හේතුවෙන් සමස්ථ අලාභය රු. මිලියන 26,922.819 ක් දක්වා සීමා කිරීමට සමත් විය.

**සංස්ථාපිත යහපාලනය**

සංස්ථාපිත යහපාලනය වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්තිය තුළ අපගේ විගණන අංශය වඩා ශක්තිමත් කරමින් අභ්‍යන්තර පාලන, මෙහෙයුම් හා මූල්‍යමය විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ කටයුතු වල සංස්ථාව නිරතව සිටියි. අපගේ සංස්ථාපිත යහපාලනය ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලවන තත්ත්වයට ගෙන ඒම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවක් මගින් ආයතනයේ මූල්‍යමය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව සියලු කටයුතු විමර්ශනයට ලක් කරයි.

### සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම අඛණ්ඩවම ලබාදීම අපගේ මුලික අභිප්‍රාය වේ. එසේම, සමස්ථ සමාජයේම අවශ්‍යතා සපුරාලනු වස් පාරිභෝගිකයාට දැරිය හැකි පිරිවැයක් යටතේ ඉන්ධන ලබා දීම අපගේ ප්‍රමුඛ අභිලාෂය වේ. එසේම, කුමන තත්වයන් යටතේ වුවද, රාජ්‍ය ආයතන සඳහා අඛණ්ඩව ඉන්ධන සැපයීමට ද සංස්ථාවට හැකි විය.

2010 වර්ෂයේ දී රුපියල් මිලියන 39,369 ක අති විශාල මුදලක් බදු හා ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට ලබා දී තිබේ.

### නිෂ්පාදනය

2010 අගෝස්තු මස 6 දින වන විට පිරිපහදුව වසර 41 ක මෙහෙයුම් කාලයක් නිමා කොට තිබේ. වර්ෂය තුළ බොරතෙල් මෙ.ටො 1,752,716 ක් පෙරසැරි කොට අති අතර, දින 317 ක් තම මෙහෙයුම් පවත්වා තිබේ. බොරතෙල් පෙරසැරි කිරීමට යොදාගත් තොගයෙන් 39.5% ක් අර්ධ නිමැවුම් ලෙස වාර්තාගත වන අතර, පෙරසැරි ක්‍රියාවලියේදී අවශෝෂණය කරගත් උත්පාදන ශක්තිය (බොරතෙල් මගින්) 5.8% කි.

### බොරතෙල් හා නිමි තොග ආනයනය

ඇ.එ.ජ. ඩොලර් මිලියන 983.744 ක් වැය කරමින් සමාලෝචිත වර්ෂය තුළ බොරතෙල් මෙ.ටො. මිලියන 1,685 ක් සංස්ථාව විසින් ආනයනය කොට තිබේ. පෙර වර්ෂයේ වාර්තා වූ සාමාන්‍ය බොරතෙල් පිරිවැය (බැරලයට) ඇ.එ.ජ. ඩොලර් 62.524 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බැරලයට ඇ.එ.ජ. ඩොලර් 79.43 ක් බවට වාර්තා විය. එමෙන්ම බොරතෙල් ආනයනයේ දී සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන කුළියේ සාමාන්‍ය අගය මෙ.ටො. 1 කට ඇ.එ.ජ. ඩොලර් 7.12 වූ අතර, එය පෙර වර්ෂයේ දී ඇ.එ.ජ. ඩොලර් 10.82 විය. ප්‍රධාන පිරිපහදු නැවතුම් කාලය තුළදී අලුත්වැඩියා කටයුතු වලට අදාළ නිවාරණ ඉංජිනේරු කාර්යයන් සියල්ලම සිදුකරන ලදී.

පිරිපහදු කල නිමිතොග මෙම වර්ෂය තුලදී මෙ.ටො. මිලියන 1.900 ක් ආනයනය කොට ඇති අතර, මේ සඳහා පිරිවැය හා ප්‍රවාහන කුළිය ඇතුලත්ව මුලු පිරිවැය ලෙස ඇ.එ.ජ. ඩොලර් මිලියන 1,279.383 ක් වැය කොට ඇත.

බොරතෙල් මිලදී ගැනීම් තෙල් නිපදවන රටවල රාජ්‍ය සමාගම් සමග එලැඹි “ කාලීන ගිවිසුම්” මත සිදුකරනු ලබයි. සමාලෝචිත වාර්ෂයේ සමස්ථ බොරතෙල් ආනයනයෙන් 91% ඉරානයෙන් (ඉරානියන් ලයිට්) ආනයනය කළ අතර, 9% සවුදි අරාබියෙන් (ඇරබියන් ලයිට්) ආනයනය කර තිබේ.

**ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් සපයන සේවාවන්**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව 2003 වර්ෂයේ ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග තෙල් තොග ගබඩා කිරීම හා කොලොන්නාව, මුතුරාජවෙල පර්යන්තයන් හා දිප ව්‍යාප්ත ප්‍රාදේශීය තොග ගබඩා 12 ක මෙහෙයුම් කටයුතු, තෙල් තොග බෙදාහැරීම් ක්‍රියාවලිය හා දත්ත සැකසුම් කටයුතු මෙම සමාගම යටතේ සිදුකරනු ලබයි.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එක්ව තෙල් පාරිභෝජනයට යොදාගන්නා අනෙකුත් ආයතනයන් සම්බන්ධ කරගෙන සතිපතා විධිමත් තොග සමාලෝචන රැස්වීම් පවත්වයි. එමගින්, රටේ පවතින සමස්ථ ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය තරම් තොග පවතින බවට තහවුරු කර ගැනීමත් හා අවශ්‍ය තෙල් තොග සපයාගැනීමට කටයුතු කිරීමත් සිදුකරයි.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ගබඩාකරණය හා මෙහෙයුම් සේවා සැපයීම හා බෙදාහැරීම වෙනුවෙන් පර්යන්ත ගාස්තුවක් (throughput) අයකරනු ලබයි. එසේම, දත්ත සැකසුම් කටයුතු කිරීම වෙනුවෙන්ද සංස්ථාවෙන් ගාස්තුවක් අයකරයි.

**ආදායම**

සමාලෝචිත වර්ෂයේ සමස්ථ අදායම රුපියල් බිලියන 256.329 කි. එය පෙර වර්ෂයේ රුපියල් බිලියන 237.622 කි.

සළකා බලන වර්ෂය තුළ ඩිසල් ලීටර් මිලියන 103.182 ක් ද, අධි සල්ෆර් දැවිතෙල් (3,500) ලීටර් මිලියන 256.705 ද, අධි සල්ෆර් දැවිතෙල් (1,500) ලීටර් මිලියන 508.842 ක්ද, අඩු සල්ෆර් අගයක් ඇති දැවිතෙල් ලීටර් මිලියන 116.605 ක්ද, නැප්තා ලීටර් මිලියන 78.455 ක්ද වශයෙන් විදුලි බල උත්පාදනය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට හා පෞද්ගලික විදුලි බල ජනන සමාගම් වෙත අලෙවි කොට තිබේ.

විදේශ ගුවන් සේවා සමාගම් සඳහා ගුවන්යානා ඉන්ධන අලෙවිය 19.8% කින් ගත වූ වර්ෂය තුළ වර්ධනය වූ අතර, එමගින් ජනිත වූ ආදායම රුපියල් මිලියන 24,199.44 කි. මුළු ගුවන්යානා ඉන්ධන අලෙවියෙන් 54.6% ක ප්‍රමාණයක් ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් වෙත අලෙවි කොට ඇති අතර, එය ප්‍රමාණාත්මකව ඉන්ධන ලීටර් මිලියන 189.678 කි.

**කෘෂි රසායන**

වගාකරුවන් හා වතුවගා අංශයට භාවිතයට ගන්නා කෘෂි රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා CPC හි සාධාරණ මිල ප්‍රතිපත්තිය අනුව යමින් අඩු පිරිවැයන් පවත්වා ගනිමින් රටේ කෘෂි කාර්මික ආර්ථිකය පුබුදුවාලීමට කටයුතු කර තිබේ.

වර්තමාන " CEYPETCO" කෘෂි නිෂ්පාදන මිශ්‍රයෙහි වල් නාශක වර්ග 5 ක් ද දිලීර නාශක වර්ග 4 ක් ද, කෘමි නාශක වර්ග 6 ක් ද ඇතුලත් වේ. අනාගතයේ අනෙකුත් කෘෂි කර්මාන්තය පදනම්ව ඇති ප්‍රදේශ කරා ද අපගේ නිෂ්පාදන මිශ්‍රය ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ඇත. තවද, රට තුළ කෘෂි කර්මාන්තය පදනම්ව ඇති ප්‍රදේශ කරා අපගේ සිපෙට්කෝ අලෙවි මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීමට සැලසුම් සකස් කරමින් සිටියි.

**මානව සම්පත් සංවර්ධනය හා සුභසාධනය**

2010 වර්ෂයේ සංස්ථාවේ සේවක ශක්තිය ස්ථිර සේවකයන් 2661 දෙනෙකුගෙන් ද අනියම් සේවකයන් 83 දෙනෙකුගෙන් ද සමන්විත විය.

සේවකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ක්‍රමයක් සංස්ථා සකසුරුවම් සමිතිය මගින් කළමනාකරණය කරනු ලබයි. සේවකයන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම පිණිස වෛද්‍යවරුන් දෙදෙනකුගේ පූර්ණ කාලීන සේවය ලබාගනී. සමාලෝචිත වර්ෂයේ දී රෝහල් ගත වීම් හා නේවාසික ප්‍රතිකාර සඳහා රුපියල් මිලියන 40.5 ක් වැය කොට ඇත. බාහිර රෝග ප්‍රතිකාර සඳහා සෑම සේවකයකුටම මාසිකව රුපියල් 250 ක දීමනාවක්ද ගෙවනු ලබයි.

පාරිතෝෂික පනතට අනුව අදාල සේවකයා සේවය කොට ඇති සෑම වර්ෂයකටම අර්ධ මාසික වැටුපට සමාන මුදලක් පාරිතෝෂික දීමනා වශයෙන් ගෙවනු ලබන අතර, සංස්ථා සකසුරුවම් සමිතිය මගින් අතිරේක විශ්‍රාම ප්‍රතිලාභයන් ද මරණ පාරිතෝෂිතද ගෙවනු ලබයි. සේවකයෙකුගේ මරණයකදී මරණ පාරිතෝෂිතයන් ද ගෙවනු ලබයි. සේවකයන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සේවක ක්‍රීඩා සමිති වෙනුවෙන් මුල්‍යාධාර සැපයීමද සංස්ථාව මගින් සිදුකරනු ලබයි. සේවකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් වෙනුවෙන් නිවාඩු නිකේතන 4 ක් නඩත්තු කරයි. සේවකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සහනදායි පොළී අනුපාතිකයන් යටතේ විවිධ ණය යෝජනා ක්‍රම කිහිපයක් ද ක්‍රියාත්මක වේ.

එමෙන්ම සේවකයන් හට දේශීය හා විදේශ පුහුණු කිරීම් වලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කොට තිබේ. සේවකයන්ගේ වැඩ පරිසරය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාවය හා භාෂා ඥානය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සේවා ලබාගැනීමට අවශ්‍ය කරන මුදල් ද වෙන්කොට තිබේ.

පහත සඳහන් පරිදි සතුටු දායක ලෙස තමන්ගේ සේවා කාලය සම්පූර්ණ කරන සේවකයන් සඳහා තිළිණ ප්‍රදානය කිරීමක් ද සිදුකරයි.

- 20 වසරක් - රු. 10,000/=
- 25 වසරක් - රන් පවුමක්
- 30 වසරක් - රු. 20,000/=
- 35 වසරක් - රු. 25,000/=
- 40 වසරක් - රු. 40,000/=

රාජ්‍ය විශ්ව විද්‍යාලයකට තේරී පත්වන සේවක දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමක් ද සංස්ථා සුභසාධන කටයුත්තක් වශයෙන් සිදුකරනු ලබයි.

**පාරිසරික ආරක්ෂණය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා වෙළඳපළ නායකයා වීමත් දේශීය පිරිපහදුවක් හිමි එකම ආයතනය වීම නිසාත් පරිසර දූෂණය අවම කිරීමට වගකීමෙන් බැඳී සිටින අතර, පරිසරයට හානියක් නොවන පරිදි ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතා කිරීමත් මෙහෙය වීමටත් බැඳී සිටී. ලෝක පාරිසරික සම්මුතීන්ට අනුගාමීව අඩු සල්ෆර් ඩීසල් නිෂ්පාදනය සඳහා පිරිපහදුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වීමට නියමිතය.

**ස්තූතිය**

ගතවූ කාලයේ මා වෙනුවෙන් සියලුම අභියෝගයන් භාරගත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා කණ්ඩායමේ සියලුම සාමාජිකයන්ට ස්තූතිය ප්‍රකාශ කරන අතර, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ගරු අමාත්‍ය තුමා හා ඔහුගේ කාර්ය මණ්ඩලයටත්, භාණ්ඩාගාරයටත්, මහ බැංකුවටත් අපගේ ව්‍යාපාරික සහකරුවන්ටත් හා සියලුම පාරිභෝගික භවතුන්ටත් ඔවුන් ලබාදුන් සහයෝගයට හා අනුග්‍රහයන් වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කර ගනිමි.



දේශමාන්‍ය ඩී.එච්.එස්. ජයවර්ධන
සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# ආකලිත වටිනාකම් ප්‍රකාශය

| | 2010 රු. මිලියන | | 2009 රු. මිලියන | |
|---|---|---|---|---|
| විකුණුම් | 279,167 | | 257,508 | |
| අමුද්‍රව්‍ය හා සේවා මිලදී ගැනීම් | (264,250) | | (212,680) | |
| **එකතු වටිනාකම** | **14,917** | | **44,828** | |
| **පහත පරිදි ගලපන ලදී** | | % | | % |
| **සේවකයන් වෙනුවෙන්** | | | | |
| වැටුප් හා අමතර ප්‍රතිලාභ | 2,308 | 15.47 | 2,301 | 5.13 |
| **ප්‍රාග්ධන සැපයුම්කරුවන් වෙත** | | | | |
| ණය සඳහා පොළි | 6,859 | 45.98 | 4,741 | 10.58 |
| **වත්කම් නඩත්තු සහ පුළුල් කිරීම් වෙනුවෙන්** | | | | |
| ක්ෂය කිරීම් | 374 | 2.51 | 353 | 0.79 |
| රඳවාගත් ලාභය/ (අලාභය) | (26,923) | (180.49) | (11,664) | 26.02 |
| **රජයට ගෙවිය යුතු** | | | | |
| බදු ගෙවීම්, මුද්දර බදු, සහ මහ භාණ්ඩාගාරය වෙත දායකත්වය | 32,299 | 216.53 | 49,096 | 109.52 |
| **එකතු වටිනාකම** | **14,917** | **100** | **48,828** | **100** |



# මූලික කරුණු

| මූල්‍ය | ඒකකය | 2010 | 2009 |
|---|---|---|---|
| දළ ආදායම | රු. මිලියන | 256,329.157 | 237,662.619 |
| දළ ලාභය/ (අලාභය) | රු. මිලියන | (9,274.607) | 2,935.631 |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | රු. මිලියන | (8,471.760) | 4,121.700 |
| මූල්‍ය වියදම් | රු. මිලියන | 6,858.899 | 4,740.664 |
| බදු පෙර ලාභය/ (අලාභය) | රු. මිලියන | (26,922.819) | (11,353.224) |
| බදු පසු ශුද්ධ ලාභය/ (අලාභය) | රු. මිලියන | (26,922.819) | (11,566.957) |
| ප්‍රාග්ධනය සහ සංචිත | රු. මිලයන | (39,951.634) | (13,038.049) |
| දිගු කාලින ණය ගැනීම් | රු. මිලියන | 29,224.531 | 33,514.223 |
| ප්‍රාග්ධන වියදම් | රු. මිලයන | 347.596 | 270.642 |
| **ආනයන** | | | |
| බොරතෙල් ආනයන | මෙ.ටොන් | 1,684,601 | 1,931,529 |
| පිරිපහදු කළ තොග ආනයන | මෙ.ටොන් | 1,900,032 | 1,449,969 |
| පිරිවැය සහ නැව් ගාස්තු වටිනාකම | රු. මිලියන | 252,714.231 | 189,848.570 |
| **මෙහෙයුම්** | | | |
| විකුණුම් | මෙ.ටොන් | 3,087.351 | 4,208.348 |
| පිරිපහදු නිමැවුම් | මෙ.ටොන් | 1,752,716 | 1,894.910 |
| **අලෙවි** | | | |
| සී.පී.සී. සතු බෙදුම්පොළවල් | | 250 | 252 |
| බෙදුම්කරුවන් සතු බෙදුම්පොළවල් | | 733 | 712 |
| බෙදුම්කරුවන් පාලනය කරන බෙදුම්පොළවල් | | 47 | 48 |
| **සේවකයන්** | | | |
| වසර අවසාන වන විට සේවකයන් ගණන | | 2,744 | 2,792 |
| වසර තුල සම්පූර්ණ ගෙවීම් | රු. මිලියන | 2,308.165 | 2,055.826 |
| සේවකයෙකුගේ එකතු වටිනාකම | රුපියල් | 841,168 | 736,327 |

# සංස්ථාපිත යහපාලනය

**යහපාලනය**

යහපාලනය පිළිබඳ සංකල්පය යටතේ යම් ආයතනයක් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේදී අවංකත්වය, විෂය මූලිකත්වය, හා පාරදෘශ්‍යතාවයකින් හා ආචාරශීලී බවකින් යුතුව කටයුතු කිරීමට බැඳී සිටියි. සංස්ථාවේ ව්‍යාපාරික අරමුණු සාක්ශාත් කරගැනීම සඳහා සංස්ථාව හා බැඳී කටයුතු කරන විවිධාකාරයෙන් සංස්ථාව කෙරෙහි උනන්දු වන පාර්ශවයන් සමග මනා සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම මෙම සංකල්පය යටතේ සිදුවේ. පිළිගත් නිතිරීති වලට අනුකූලව ආයතනයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටි. එසේම, මෙහෙයුම් කටයුතු කරගෙන යාමේදී ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සෑම පාර්ශවයකටම ඉහළ මට්ටමේ ආචාරධර්ම පද්ධතියකට අනුව කටයුතු කිරීමට ආයතනය කටයුතු කරයි. ජාතික ආර්ථිකයේ සුවිශේෂි කාර්‍යභාරයන් ඉටුකරමින් වඩාත් පරිසර හිතකාමි ලෙස මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යමින් වඩාත් පාරිදෘෂ්‍ය භාවයකින් සහ ගිණුම්කටයුතු භාවයකින් යුතුව සංස්ථාවේ විවිධ අංශ වල කටයුතු ඉටුකරමින් ඛනිජ තෙල් ආශ්‍රිත දිගු කාලින අරමුණු සාක්‍ෂාත් කරගැනීම කෙරෙහි සංස්ථාවේ යහපාලන මූලධර්ම යොමුව පවති.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම පද්ධතියට අනුව මගපෙන්වීමක් ලබාගැනීමට සංස්ථාව කටයුතු කර තිබේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත වූ රාජ්‍ය සංස්ථාවකි. එසේම 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව සංස්ථාවේ සංයුක්ත සැලැස්ම, අයවැය, ගිණුම් කටයුතු විගණනය, අතිරික්තයන් විසර්ජනය කිරීම් හා ණයට ගැනීම් ආදිය පිළිබඳ පාලනයකින් කටයුතු කිරීමට බැඳී සිටි. එයට අමතරව මුදල් අමාත්‍යංශය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශ විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුව කටයුතු කිරීමටද බැඳී සිටියි.

**අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සංයුතිය**

සභාපති හා කළමනාකාර අධ්‍යක්‍ෂ ඇතුලුව විධායක නොවන අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන් 7 දෙනෙකුගෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය සමන්විත වේ. සභාපති හා කළමනාකාර අධ්‍යක්‍ෂ හා අනෙකුත් අධ්‍යක්‍ෂවරුන් ගරු ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමතිවරයා විසින් 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් සංස්ථා පනතේ (පසුකාලින සංශෝධනයන්ද ඇතුලුව) විධිවිධාන යටතේ පත්කරනු ලබයි.

මුදල් අමාත්‍යංශය නියෝජනය කරමින් එක් අධ්‍යක්‍ෂවරයෙක්, සංස්ථා අධ්‍යක්‍ෂ මණ්ඩලය නියෝජනය කරයි. නැවත පත් කිරීමට යටත්ව අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පත්වීම වසර 3 කට සීමාවේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අධ්‍යක්‍ෂ මණ්ඩලය සංස්ථාවේ ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්ගේ හා අවශ්‍ය වූ විට බාහිර වෘත්තියවේදීන්ගෙන් ද අවශ්‍ය තොරතුරු ලබාගනි.

සංස්ථාව පාලනය වන ව්‍යවස්ථාපිත නීති වලට අනුකූලව ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට අධ්‍යක්‍ෂ මණ්ඩලය බැඳී සිටි. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට අවශ්‍ය අනුමැතිය ලබාදීම, වාර්ෂික අයවැය, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරි සැලැස්ම යන ආදියට අනුමැතිය ලබා දීමත්, මූල්‍ය ක්‍රියාකාරිත්වය කාලිනව සමාලෝචනයට ලක්කිරීමත් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

එසේම, සංස්ථාවේ ඉහළ තනතුරු වලට නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම හා ප්‍රාග්ධන වියදම්, ආයෝජනය හා මූල්‍ය ණය පහසුකම් ලබාගැනීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය හා අනුමැතිය ලබා ගනී.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසික පදනම මත පවත්වන අතර, අවශ්‍ය වූ විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වෙති.

විධිමත් න්‍යාය පත්‍රයක් යටතේ මෙම රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පෙරාතුව අවශ්‍ය පසුබිම් තොරතුරු සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදෙයි. සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 8 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා සියලුම අධ්‍යක්ෂ වරුන් සහභාගි වී තිබේ.

**අනුකූලත්වය හා පාරදෘෂ්‍යභාවය**

සියලුම මෙහෙයුම් කටයුතු කිරීමේදී වඩාත් පාරදෘෂ්‍යභාවයකින් කටයුතු කිරීමට සංස්ථාව බැඳී සිටී. ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ගණකාධිකරණ ප්‍රමිත හා වෙනත් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමට සංස්ථාව ක්‍රියාකර තිබේ. සංස්ථාවේ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කොට තිබේ. 1971 අංක 38 දරණ මුදල් පනත විධිවිධානයන්ට අනුව, මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන අතර, පාර්ලිමේන්තුවේද සභාගත කරයි. එයට අමතර වශයෙන් මුදල් පනතට අනුකූලව විගණකාධිපතිවරයා විසින් සංස්ථාවේ බාහිර විගණනය සිදුකරනු ලබයි.

**සංස්ථාපිත කළමනාකරණය**

කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ක්‍රමෝපායන් හා මග පෙන්වීම්, ප්‍රතිපත්ති සම්පාදනයන්, පිළිවෙත් පදනම් කරගනිමින් සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂක සංස්ථාවේ දෛනික කටයුතු පවත්වාගෙන යයි.

පිරිපහදුවේ මෙහෙයුම් කටයුතු හා ප්‍රධාන කාර්යාලයේ පරිපාලන කටයුතු (ප්‍රාදේශීය කාර්යාලවල පරිපාලනයද ඇතුලුව) වශයෙන් සංස්ථාවේ මෙහෙයුම් හා ප්‍රධාන පරිපාලන කටයුතු කොටස් දෙකකට බෙදිය හැකිය. විදුලි, රසායන හා යාන්ත්‍රික ක්ෂේත්‍ර නියෝජනය කරන නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන්ගේ සහාය ඇතිව පිරිපහදු කළමනාකාරවරයා පිරිපහදුව පවත්වාගෙන යයි.

ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ කාර්යාංශ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයෙකුගේ හෝ කළමනාකාර වරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, සංස්ථාවේ දෛනික පරිපාලන කටයුතු කරගෙන යාමට සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ වරයාට ඔවුන්ගේ සහාය ලබා දෙයි. සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ඒ ඒ ක්ෂේත්‍ර වලට අදාලව අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් ලබාගත් අයගෙන් සමන්විත වෙයි.

## විගණන කමිටුව

### විගණන කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. සමාලෝචිත වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත් වූ අතර, ඉන් දෙකක සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂක, මෛත්සිරි විජේගුණවර්ධන මහතා විසින් ද සෙසු විගණන කමිටු දෙකෙහි සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂ, උදය රංජිත් සෙනෙවිරත්න මහතා විසින් හොබවන ලදි. අනෙකුත් විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනකු වශයෙන් ඩේවිඩ් චරිත ගුණවර්ධන මහතාත් (45 විගණන කමිටුව දක්වාත්) ඩබ්.කේ.ඩී. වේරගම මහතා (46 වැනි විගණන කමිටුව දක්වාත්) චම්පිකා දිල්හාරා අමරසේකර මිය හා සන්ධ්‍යා විජයබණ්ඩාර මිය සමාලෝචිත වර්ෂයේදී ක්‍රියා කළහ. මෛත්සිරි විජේගුණවර්ධන මහතා එක්සත් රාජධානියේ සහතික ලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය ලැබූ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මූල්‍ය ක්ෂේත්‍ර වල විශේෂඥ දැනුමක් ලැබූ අයෙකු වේ. එසේම, උදය සෙනෙවිරත්න මහතා මුදල් අමාත්‍යාංශය විසින් සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද අයෙකි. සංස්ථාවේ අභ්‍යන්තර විගණන කළමනාකාරවරයා විගණන කමිටුවේ ලේකම් ලෙස ක්‍රියාකරයි.

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මූලික අංග අනාවරණය වන ලෙස සැකසූ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද විගණන ප්‍රඥප්තියක් මගින් (audit charter) විගණන කමිටුවේ විෂය පථය හා බලතල නිර්ණය වී තිබේ.

### විගණන කමිටුවේ කාර්යභාරයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා වාර්තා කිරීම සඳහා යොදාගන්නා ගණකාධිකරණ ප්‍රතිපත්තීන් වල සර්ව සම්පූර්ණ බව, විශ්වසනීයත්වය, යථාරූපීබව සහ ප්‍රමාණවත් හෙළිදරව් කර ඇත්ද යන්න පිළිබඳ සමාලෝචනයක් සිදුකිරීම විගණන කමිටුවේ ප්‍රධාන කාර්යකි. එලෙස කටයුතු කිරීමේදී ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගන්නා ගිණුම් ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම් ප්‍රමිතීන් වලට අනුකූල වන්නේ දැයි යන්න පිළිබඳව සමාලෝචනයක් සිදුකරයි. එයට අමතරව විගණන ප්‍රඥප්තියෙහි දක්වා ඇති අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධතින් කෙරෙහි විගණන කමිටුවේ මූලික අවධානය යොමු වේ. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති වාර්තා හා අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම් පිළබඳව ද කමිටුවේ මූලික අවධානය යොමුවේ.

### විගණන කමිටු රැස්වීම්

විගණන කමිටුවේ විෂය පථයට අදාල ක්ෂේත්‍රයන් හී කරුණු සාකච්ඡා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 4 ක් පවත්වා තිබේ.

එම කමිටු වලට සහභාගි වූ අයගේ සංයුතිය පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | දිනය | ස්ථානය | කමිටු සාමාජිකයන් ගණන | පැමිණි සාමාජිකයන් ගණන | පැමිණි සාමාජිකයන්ගේ නම් |
|---|---|---|---|---|---|
| 45 | 26/03/2010 | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ප්‍රධාන කාර්යාලය කොළඹ 03. | 03 | 03 | එම්. විජේගුණවර්ධන මහතා<br>ඩබ්.කේ.බී. වේරගම මහතා<br>ඩී.සී. ගුණරත්න මහතා |
| 46 | 20/09/2010 | -එම- | 03 | 03 | යූ.ආර්. සෙනෙවිරත්න මහතා<br>එම්. විජේගුණවර්ධන මහතා<br>සී.ඩී. අමරසේකර මහත්මිය |
| 47 | 29/10/2010 | -එම- | 03 | 03 | යූ.ආර්. සෙනෙවිරත්න මහතා<br>එම්. විජේගුණවර්ධන මහතා<br>සී.ඩී. අමරසේකර මහත්මිය |
| 48 | 01/12/2010 | -එම- | 03 | 03 | එම්. විජේගුණවර්ධන මහතා<br>සී.ඩී. අමරසේකර මහත්මිය<br>එස්. විජයබණ්ඩාර මහත්මිය |

**විගණන කමිටුව විසින් කරන ලද කාර්යයන්**

සංස්ථාවට අදාල ක්‍රමෝපායික ප්‍රශ්න රාශියක් විගණන කමිටුව විසින් සමාලෝචිත වර්ෂයේ සාකච්ඡාවට බඳුන්විය. එම ක්ෂේත්‍රයන් පහත දැක්වේ.

1. සංස්ථාවේ නිෂ්ක්‍රිය වත්කම්

2. තිරණ ගැනිමේ ක්‍රියාවලියට අවශ්‍ය තොරතුරු හා විශ්වාසනිය අභ්‍යන්තර මුල්‍ය තොරතුරු ලබාගැනිම සඳහා ක්‍රමෝපායික ව්‍යාපාරික අංශ හා පිරිවැය මධ්‍යස්ථාන හඳුනා ගැනිමේ ක්‍රියාවලියක් හඳුන්වා දිම.

3. අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු යැවීමට සම්බන්ධව පියවර ගැනිම.

4. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව හා ඒ සම්බන්ධව ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තාව විමර්ශනයට ලක් කිරිම.

5. ආයතනය විසින් මුහුණපාන ප්‍රධාන අවදානම් හා ගැටළු හඳුනාගෙන එම අවදානම් ක්ෂේත්‍ර අවම කිරිමට අවශ්‍ය පියවරයන් සාකච්ඡා කිරිම.

6. ප්‍රධාන කාර්යාලිය ගොඩනැගිල්ල ඉදිකිරිමේ ප්‍රගතියත්, ආයතනික සම්පත් සැලසුම්කරණ (ENTERPRISE RESOURCE PLANNING) ව්‍යාපෘතියේ ප්‍රගතියත් සමාලෝචනයට ලක් කිරිම.

7. රජයේ දෙපාර්තමේන්තු වලින් හා රාජ්‍ය වානිජ ව්‍යවසායන්ගෙන් ලැබිය යුතු වෙළඳ ණය අයකර ගැනිම පිළිබඳ ප්‍රගතිය විමර්ශනයට ලක්කිරිම.

8. වාර්ෂික විගණන සැලසුම සාකච්ඡා කිරිම හා එය අනුමත කිරිමත්, අභ්‍යන්තර විගණන කාර්යාංශයේ කාර්ය සාධනය විමර්ශනයට ලක්කිරිම.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනකුගෙන් සමන්විත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් උසුලනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා වල අඩංගු කරුණු සාකච්ජා කිරීම සඳහා මසකට වරක් මෙම කමිටුව රැස්වේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා එහි වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, කාර්යාංශ ප්‍රධානින් මෙම කමිටුවට සහභාගි වෙති.

## මූල්‍යමය හෙළිදරව් කිරීම්.

සංස්ථාවේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණත්වය පිලිඹිබු වන ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගණකාධිකරණ ප්‍රමිතයන්, මුදල් පනතේ හා ඛනිජ තෙල් සංස්ථා පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේ.

## අභ්‍යන්තර පාලනයන්

සංස්ථාවේ වත්කම් ආරක්ෂා වන පරිදි, ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගෙන යාමත්, එහි සඵලදායකත්වය සුපරීක්ෂණයට ලක්කිරීමටත්, අධ්‍යක්ෂක මණ්ඩලය වගකීමකට බැඳේ. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමටත්, මනා වාර්තා හා විශ්වාසවන්ත තොරතුරු ජනිත කිරීම සඳහා යෝග්‍ය පාලනයක් ක්‍රියාවේ යෙදවීම අභ්‍යන්තර පාලනයෙන් අදහස් කෙරේ. මෙම අභ්‍යන්තර පාලන පද්ධතියට මූල්‍ය පාලනයන්, මෙහෙයුම් පාලනයන් සහ තහවුරු පාලනයන් මෙන්ම අවදානම් කළමනාකරණයද ඇතුලත් වේ. ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියකින් කළ හැක්කේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය කෙරෙහි සාධාරණ පදනමක් ගොඩනැගීම මිස වංචා හා වැරදි, අක්‍රමිකතා අනාවරණය කර ගත හැකි වන පරිදි සර්ව සම්පූර්ණ සහතික වීමක් සැපයිය නොහැකි බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ආයතනයේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, පවතින අභ්‍යන්තර පාලන පද්ධතීන් වල සම්පූර්ණත්වය හා පාලන පිළිවෙත් වල පවතින අඩුපාඩු මග හැරවීම සඳහා කාලීනව නිර්දේශ ඉදිරිපත් කිරීම නිරතුරුව සිදුකරයි.

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෘත්තීය සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරී වරයෙකුගේ ප්‍රධානත්වයෙන් විගණන කටයුතු සිදුකරයි. අභ්‍යන්තර පාලනය පිළිබඳ විමර්ශනයන් සිදුකිරීම, අවධානම් අංශ පිළිබඳ විමර්ශනය, සංස්ථාවේ පවතින මෙහෙයුම් පද්ධති වල ක්‍රියාකාරිත්වය පිළිබඳව සාධාරණ, යථානුරූපී ලෙස විමර්ශනය කරමින් අනුකූලතා හා තහවුරු පරීක්ෂාවන් මගින් ඒවායේ යථාපැවත්ම ඇගයීමට ලක්කිරීම මූලික වශයෙන් සිදුකරයි.

මූලික විගණන පරීක්ෂාවන්ට පරිබාහිර වශයෙන් සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ අභ්‍යන්තර විගණනයේ පරීක්ෂාවන් සිදුවිය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදාගන්නා ගණකාධිකරණ ප්‍රතිපත්ති වල ප්‍රමාණාත්මක භාවය හා අනුකූලත්වය අභ්‍යන්තර විගණනය විසින් විමර්ශනයට ලක්කිරීම.

1. මෙහෙයුම් හා ණය අයකර ගැනීමේ අවධානමද ඇතුලත් වන පරිදි ආයතනය මුහුණ දෙන ප්‍රධාන අවධානම් වලට අදාලව පවතින පද්ධති හා පිළිවෙත් කවරේද යන්නත් ඒවායේ පාලනය හා ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම.

2. සංස්ථාව විසින් බාහිර විගණන විමසුම් වලට යවන පිළිතුරුවල සාධාරණත්වය ඇගයීමත්, විගණකාධිපති වරයාට යවන පිළිතුරු වල යථානුරූපී බව ඇගයීමට ලක්කිරීම.

3. විගණකාධිපති වරයාගේ කාර්ය මණ්ඩලය සමග සාකච්ජා කරමින් පවතින සම්පත් වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

4. ආයතනයේ පවතින අභ්‍යන්තර පාලන පද්ධතීන් හා ඒවායේ සක්‍රියත්වය, වත්කම් ආරක්ෂා කිරීමට හා මූල්‍ය ප්‍රකාශන වල විශ්වාසනීයත්වයට බලපාන ආකාරය පිළිබඳ විමර්ශනයට ලක්කරමින් අභ්‍යන්තර විගණන පරීක්ෂා සිදුකර විගණන විමසුම් යොමු කිරීම.

**මහා භාණ්ඩාගාරය සමග ඇති සබඳතාව**

සංස්ථාවේ භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන වල උපදෙස් අවස්ථානුකූලව සංස්ථාව ලබාගනී. එසේම, ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති වලට අදාල ආයෝජන හා ප්‍රාග්ධන හා මෙහෙයුම් කටයුතු වලට අදාලව ණය ලබාගැනීමේදීද අවශ්‍ය උපදෙස් ලබාගැනීම සිදුකරයි.

# මූල්‍ය ප්‍රකාශන

ආදායම් ප්‍රකාශනය

ශේෂ පත්‍රය

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

# ආදායම් ප්‍රකාශනය

## අදායම් ප්‍රකාශය

2010 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

| මෙහෙයුම් ලාභය/ අලාභය | 5,100.206 | 10,369.899 | 5,862.559 | 5,221.644 | 10,681.491 | (483.184) | 5,912.381 | (12,813.004) | (7,357.162) | |
| **කාරක ප්‍රාග්ධන අයිතම වෙනස්වීම්** | | | | | | | | | | |
| වෙනත් (අඩුවීම)/ වැඩිවීම | 1,845.314 | (3,099.970) | 1,844.676 | (5,157.403) | (4,066.365) | (9,184.440) | (13,321.526) | 8,673.831 | 5,962.155 | (15,922.08) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (අඩුවීම) / වැඩිවීම | (2,143.290) | 711.285 | (384.386) | 789.614 | (3,434.619) | (2,852.640) | (13,098.772) | (32,409.849) | (9,365.376) | (5,283.96) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල (පහළ යාම)/ ඉහළ යාම | (3,215.520) | (4,571.558) | (1,792.170) | 2,862.133 | (1,838.767) | 11,099.326 | 23,813.340 | 39,946.795 | 57,438.630 | 25,211.64 |
| අඩුකලා - පාරිතෝෂික / බදු හා පොළී ගෙවීම් | (3,250.230) | (2,788.440) | (617.268) | (880.768) | (2,072.717) | (5,613.107) | (3,268.480) | (4,625.380) | (4,871.602) | 6,858.90 |
| මෙහෙයුම් කටයුතු වලින් උපයාගත් මුදල් | (1,663.520) | 621.216 | 4,13.411 | 2,835.220 | (730.977) | (7,034.045) | 36.943 | (1,227.607) | 41,807.644 | 24,169.25 |
| ආයෝජන සඳහා යොදාගත් මුදල් | (2,173.473) | (1,899.240) | (3,421.404) | 246.165 | 317.925 | 662.033 | 1,165.988 | 40.605 | (308.564) | (3,376.18) |
| මුල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ | 1,797.652 | 2,069.996 | 1,880.855 | 1,050.684 | 13,020.883 | (2,478.143) | (3,326.039) | (1,001.410) | (21,339.770) | (4,379.07) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ (පහළ යාම)/ ඉහළ යාම | (2,039.341) | 791.972 | 3,372.892 | 4,132.069 | 12,607.831 | (8,850.155) | (2,123.108) | (2,188.412) | 20,159.310 | (31,924.50) |
| වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | (2,068.229) | 28.888 | 820.860 | 4,193.752 | 8,325.821 | 20,933.652 | 12,083.497 | 9,960.389 | 7,771.977 | 27,963.38 |
| වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | 28.888 | 820.860 | 4,193.752 | 8,325.821 | 20,938.652 | 12,083.497 | 9,960.389 | 7,771.977 | 27,931.287 | (3,961.12) |

# දස වසරක සාරාංශය

## විදේශ විනිමය ඉපයීම් හා ගෙවීම්

| රු. මිලියන | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ගුවන්තෙල් විකුණුම්** | | | | | | | | | | |
| විදේශ ගුවන් සේවා | 31.10 | 32.40 | 48.30 | 57.00 | 77.42 | 84.54 | 75.28 | 104.75 | 54.795 | 88.072 |
| සෘජු අපනයන | 16.50 | 13.10 | – | 7.00 | – | 23.09 | -- | -- | – | 20.456 |
| එකතුව - ඇ.ඒ.ජ. ඩොලර් මිලියන | 47.60 | 45.50 | 48.30 | 64.00 | 77.42 | 107.63 | 75.28 | 104.75 | 54.795 | 108.528 |
| රුපියලට සමාන | 3,561.50 | 3,977.70 | 350.80 | 6,458.50 | 7,159.01 | 8.714.050 | 8,264.68 | 11,262.99 | 6,298.137 | 12,354.760 |
| **ආනයන වියදම** | | | | | | | | | | |
| බොරතෙල් (US $ MIL) | 353.90 | 408.00 | 431.00 | 597.00 | 747.20 | 1,028.50 | 1,023.00 | 1,330.90 | 964.925 | 983.753 |
| නිමි තොග (US $ MIL) | 304.00 | 286.00 | 300.00 | 464.00 | 653.00 | 761.30 | 996.00 | 1,449.39 | 774.937 | 1,280.126 |
| **එකතුව - ඇ.ඒ.ජ. ඩොලර් මිලියන** | **657.90** | **694.00** | **731.00** | **1,061.00** | **1,400.20** | **1,789.80** | **2,019.00** | **2,780.30** | **1,739.862** | **2,263.879** |
| සාමාන්‍ය බොරතෙල් ( මි.ර.ගැ) මිල | 24.67 | 25.00 | 29.29 | 37.38 | 52.14 | 65.07 | 71.97 | 97.65 | 63.48 | 79.73 |
| සාමාන්‍ය විනිමය අනුපාතය (US $ 1 = Rs) | 89.62 | 96.34 | 96.42 | 101.90 | 100.53 | 103.96 | 111.49 | 108.33 | 114.94 | 113.84 |
| **වෙනත් කළමනාකරණ තොරතුරු** | | | | | | | | | | |
| **වෙළඳ ප්‍රතිඵල** | | | | | | | | | | |
| ආදායම | 95,103.19 | 105,001.92 | 111,389.49 | 135,351.98 | 174,554.98 | 211,012.85 | 253,344.38 | 358,002.12 | 257,508.193 | 276,550.970 |
| බදු පසු ලාභය/ (අලාභය) | 1,169.31 | 9,986.09 | 4,874.19 | 3,907.86 | 7,710.89 | (946.22) | 2,862.34 | (14,952.52) | (12,343.64) | (26,922.819) |
| **යෙදවූ වත්කම්** | | | | | | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 7,630.24 | 10,844.72 | 4,504.43 | 4,450.67 | 4,512.45 | 4,460.92 | 4,374.65 | 4,624.07 | 5,041.139 | 8,280.085 |
| ශුද්ධ ජංගම වත්කම් | (16,738.53) | (12,165.68) | (6,785.13) | (2,728.74) | 17,763.40 | 14,519.33 | 15,138.46 | (2,585.38) | 7,323.200 | (28,938.672) |
| **එකතුව** | **(9,108.29)** | **(1,320.96)** | **(2,280.69)** | **1,721.93** | **22,275.85** | **18,980.25** | **19,513.11** | **2,038.69** | **12,364.339** | **(20,658.587)** |
| **යෙදවූ මුදල්** | | | | | | | | | | |
| ප්‍රාග්ධනය | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.000 |
| සංචිත | 15,039.418) | (8,588.86) | (2,253.79) | 1,984.13 | 11,673.46 | 10,065.95 | 12,557.40 | (2,416.40) | (14,716.700) | (40,951.600) |
| **එකතුව** | **(14,039.42)** | **(7,588.86)** | **(1,253.79)** | **2,984.13** | **12,673.46** | **11,065.95** | **13,557.40** | **(1,416.40)** | **(13,716.700)** | **(39,951.600)** |
| ප්‍රාග්ධන වියදම් | (2,306.03) | (4,001.34) | (5,255.00) | (253.00) | (78.00) | (255.00) | (242.68) | -- | – | -- |
| **සේවක ඉපයීම්** | | | | | | | | | | |
| වැටුප් | 1,620.89 | 1,496.24 | 1,461.01 | 1,201.36 | 986.43 | 1,221.59 | 1,429.80 | 1,668.72 | 1,815.765 | 2,056.067 |
| ප්‍රසාද දීමනා | 125.80 | 112.88 | 186.67 | 101.93 | 84.74 | 129.69 | 149.01 | 211.85 | 240.061 | 252.098 |
| සේවකයකුගේ සාමාන්‍ය වාර්ෂික ඉපයීම | 243.51 | 224.86 | 759.30 | 531.53 | 419.41 | 461.19 | 538.66 | 664.04 | 736.327 | 841.168 |
| සේවක සංඛ්‍යාව | 7,173.00 | 7,156.00 | 2,170.00 | 2,452.00 | 2,540.00 | 2,930.00 | 2,931.00 | 2,832.00 | 2,792 | 2,744 |
| **මූල්‍ය අනුපාත** | | | | | | | | | | |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ % | – | – | – | 130.90 | 60.84 | (15.77) | 21.10 | -- | – | -- |
| පිරිවැටුමට පිරිවැටුම් ප්‍රතිලාභ % | 21.00 | 14.65 | 5.67 | 3.22 | 4.76 | (0.87) | 1.20 | (4.38) | (5.22) | (0.11) |
| පිරිවැටුමට ණයගැතියෝ % | 0.05 | 0.03 | 0.04 | 0.06 | 0.08 | 0.09 | 0.13 | 0.02 | 0.31 | 0.30 |
| ස්ථාවර වත්කම් වලට පිරිවැටුම වරක් | 9.78 | 7.39 | 19.07 | 27.31 | 35.87 | 44.45 | 53.43 | 78.01 | 55.50 | 60.50 |
| පිරිවැටුමට නිමි තොග වරක් | 0.05 | 0.05 | 0.05 | 0.07 | 0.06 | 0.09 | 0.09 | 0.07 | 0.064 | 0.10 |
| ජංගම අනුපාතය වරක් | 0.50 | 0.60 | 0.70 | 0.92 | 1.48 | 1.33 | 1.22 | 0.98 | 1.057 | 0.82 |
| ද්‍රවශීලතා අනුපාතය වරක් | 0.23 | 0.24 | 0.45 | 0.53 | 1.00 | 0.74 | 0.64 | 0.07 | 0.86 | 0.57 |
| පොළී අනුපාතය වරක් | 1.47 | 9.91 | 9.96 | 6.78 | 8.81 | 0.35 | 1.28 | (4.07) | (2.60) | (3.93) |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව

## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

## AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: එල්පී/ඩී/සීපීසී/එෆ්ඒ/2010 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2012 පෙබරවාරි 24 දින. |

සභාපති

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 නොවැම්බර් 25 දින සංස්ථාවේ සභාපතිවරයා වෙත නකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ– மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම.**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිය වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

---

2.1 **මතය.**

---

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

2.1.1 **අඛණ්ඩ පැවැත්ම**

---

සමාලෝචිත වර්ෂයේ සංස්ථාව රු. මිලියන 26,923 ක (බදු ගැලපීම් රහිත ) පාඩුවක් ලබා තිබුණු අතර සෘණ ස්කන්ධ තත්ත්වය රු. මිලියන 39,952 ක් විය. ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් මූල්‍ය ආයතන වලින් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගෙන යාම පිළිබඳව සැකයක් ඇති වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදවී ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පිඑඩි 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය පරිදි කෙටුම්පත් වාර්ෂික ගිණුම් ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, වාර්ෂික ගිණුම් ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2011 මැයි 11 දිනදීය. අදහස් දැක්වීම් හා නිරීක්ෂණ එම වාර්ෂික ගිණුම් ප්‍රකාශන මත පදනම් වේ.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා භාණ්ඩාගාරය විසින් 2009 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ලංකා ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් වලින් 1/3 ක් 2009 ඔක්තෝබර් 21 දින සංස්ථාවට පවරා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හිමි ලංකා ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මුළු කොටස් අයිතිය 2/3 දක්වා වැඩිවිය. මෙම කොටස් පවරා දීම සංස්ථාව විසින් 2009 සහ සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 26-ඒකාබද්ධ සහ වෙන්වූ මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතියට අනුකූලව ඒකාබද්ධව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

**මේ පිළිබඳව සභාපතිවරයා 2011 දෙසැම්බර් මස මා වෙත පහත පරිදි ප්‍රකාශ කරන ලදී.**

**කෙසේ වෙතත් පහත සඳහන් හේතු මත සංස්ථාවට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ නොහැකි බව සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.**

I. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ (පරිපාලක සමාගම) මූල්‍ය වාර්තා කාල පරිච්ඡේදය පරිපාලිත සමාගමෙන් (ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම) වෙනස් වීම.

II. ලංකා ඛණිජ තෙල් සංස්ථාව විසින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන කාල සීමාව වන විට ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන හෝ විගණිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම.

III. සමාන අවස්ථාවන් වලදී සිදුවන ගනුදෙනු හා සිද්ධීන් සඳහා ඒකීය ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු වීම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මේ සඳහා වෙනස් වූ ශේෂ පත්‍ර දිනයන්ට අදාලව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්තය විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ ගැඹුරු පරීක්ෂාවක් කිරීම අවශ්‍ය වේ.

ඊට අමතරව අන්තර් සමාගම් ජංගම ගිණුම් සැසඳුම් ප්‍රකාශය පිළිබඳව නොඑකඟතාවක් තිබී ඇත. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් නොඑකඟතාවන් විසදා ගෙන ඇති අතර ඉතිරි පශ්න, ඉක්මන් විසඳුමක් ලබාගැනීම සඳහා ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යංශයේ වැඩ බලන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
ශ්‍රී.ල.ගි.ප්‍ර.26 හි දක්වා ඇති පරිදි ඉහත සඳහන් ගැටළු මත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ඉඩ දෙනු නොලැබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි. ප්‍ර. 18-දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි නියමකර ඇති පරිදි ධාරණ අගය ශේෂ පත්‍ර දිනට නිශ්චය කෙරෙන සාධාරණ අගයෙන් ප්‍රමාණවත් පරිදි වෙනස් වී නොමැති බව තහවුරු කර ගැනීම සඳහා සංස්ථාව වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම රු. මිලියන 559 ක් වූ වත්කම් වල ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් පොත් වලට ගැනීමෙන් තොරව සංස්ථාව විසින් අඛණ්ඩව තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් තිබේ. ඊට අමතරව 2010 වර්ෂයේදී එකතු කරන ලද වටිනාකම රු. මිලියන 18.6 ක් වූ වත්කම් ක්ෂය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 41-හානිකරණ වත්කම් ප්‍රමිතියෙහි අවශ්‍යතාවය අනුව සංස්ථාව විසින් එහි වත්කම් සඳහා හානිකරණ දර්ශකයන් (indicators) හඳුනා ගැනීමට උචිත පරිපාටි හඳුනාගෙන නොතිබුණි. මෙම අනුකූල නොවීම නිසා රු. මිලියන 9,549 ක් වූ දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගයන් ඒවායේ අය කරගත හැකි අගය සමග සැසඳීමට නොහැකි වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ප්‍රතිපාදනය ගණනය කිරීමේදී පාරිතෝෂික සූත්‍ර ක්‍රමය හෝ ආයුගණක ක්‍රමය යොදා ගත යුතුය. කෙසේ වුවද සංස්ථාව විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ප්‍රතපාදනය කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 27 ආශ්‍රිත සමාගම් වල ආයෝජන හි අවශ්‍යතාවයට අනුව ආශ්‍රිත සමාගමේ කරන ලද රු. මිලියන 2500 ක ආයෝජන ස්කන්ධ ක්‍රමය පදනම් කරගෙන ගිණුම්ගත කර නොතිබුණ අතර සමුච්චිත වත්කම්, වගකීම්, ආදායම් සහ ලාභ

හෝ අලාභ ඇතුළු ආශ්‍රිත සමාගමේ මූල්‍ය තොරතුරු සාරාංශ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 03 - වත්කම් සහ වගකීම් හා ආදායම් සහ වියදම් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියෙන් ඉඩදීම හෝ අවශ්‍යතාවය මත හැර හිලව් නොකළ යුතුය. ණයගැතියන්ගේ බැර ශේෂයන්ගේ වටිනාකම වූ රු. මිලියන 334.1 ක් ණයගැති ශේෂයන් වූ රු. මිලියන 78,143 ක් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 3 ප්‍රතිපාදන වලට එරෙහිව හිලව් කර තිබූ බව නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 3 ට එරෙහිව රු. මිලියන 43.9 ක් වූ බොල් ණය ප්‍රතිපාදනය ශේෂ පත්‍රයේ මුහුනත නොදක්වා ලැබිය යුතු දෑ ශේෂයට එරෙහිව හිලව් කර තිබූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ට අනුකූලව ඉදිරියට ගෙනා සහ කාලපරිච්ඡේදයේ අවසානයට වූ බොල් ණය ප්‍රතිපාදනය හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

විගණනයේදී පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) සමාලෝචිත වර්ෂය සඳහා උපචිත බැංකු ගාස්තු රු.මිලියන 82.9 ක් අඩුවෙන් ගණනය කර තිබූ බව නිරීක්ෂණය විය.

ආ) ගුවන් සේවා කොන්ත්‍රාත් කරුවන් තිදෙනෙකුට අදාල එකතුව රු.මිලියන 28.7 ක් වූ තැන්පතු, තැන්පතු ගිණුම් වලට බැර කිරීම වෙනුවට ණයගැති ගිණුම් වලට බැර කර තිබුණි.

ඇ) 2010 වර්ෂයට අදාල ආදායම් බදු මූල්‍ය ප්‍රකාශන වල වෙන් කර නොතිබුණි.

### 2.2.4 ඉදිරි සුරැකුම් ගනුදෙනු

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අනුව, ජාත්‍යන්තර බේරුම්කරණ ලන්ඩන් අධිකරණය මගින් බේරුම්කරණ ක්‍රියාවලිය පවත්වා ගෙන යමින් තිබූ අතර වාණිජ බැංකු ගණනාවක් සමග ඇතුලත් වූ ඉදිරි සුරැකුම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් බේරුම් කරන ක්‍රියාවලියේ පාර්ශවයක් ලෙස සංස්ථාව පෙනී සිට තිබුණි. ජාත්‍යන්තර බේරුම්කරණ ලන්ඩන් අධිකරණයේ මෙම ක්‍රියාවන්හි ප්‍රතිඵලය අවසාන වී නොතිබුණු අතර සංස්ථාව විසින් එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි වගකීම හඳුනාගෙන නොතිබුණි. තවද මෙම අවස්ථාවන් යටතේ ඇති වගකීම් ස්වාධීනව සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි ගනුදෙනු වලට අදාළ තොරතුරු සංස්ථාව විසින් ඉදිරිපත් කර නොතිබිණි. තවද මෙම කොන්ත්‍රාත්තු වලින් පැන නගින සියළු වගකීම් සංස්ථාව විසින් ප්‍රමාණවත් පරිදි හඳුනාගෙන ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

2.2.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2009 **දෙසැම්බර්** 31 **දිනට හිඟහිටි ශේෂයන් පිළිවෙලින් රු. මිලියන** 52.8 **ක් රු. මිලියන** 3,443.6 **ක් වූ ගුවන් සේවා කොන්ත්‍රාත් ගනුදෙනුකරුවන් දෙදෙනෙකුගෙන් හා පෞද්ගලික ගනුදෙනුකරුවන් දෙදෙනෙකුගෙන් බැංකු ඇපකර ලබා ගෙන නොතිබුණි.**

(ආ) **ලංකා විදුලිබල මණ්ඩලයෙන්** 2010 **දෙසැම්බර්** 31 **දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.මිලියන** 52,394 **ක් විය. ඉන්** 88% **ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි. මේ අතර ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු රු. මිලියන** 1,031 **ක ශේෂයක් සම්බන්ධයෙන් ආරවුලක් ඇති වී තිබුණි.**

ඇ) **නියෝජිතයන්** 38 **දෙනකු, විදුලි ජනක** (power point) **ගනුදෙනු කරුවන් දෙදෙනෙකු හා පෞද්ගලික ගනුදෙනු කරුවන් දෙදෙනෙකු විසින් සංස්ථාව විසින් සපයා තිබූ ණය සීමාව ඉක්මවා තිබූ අතර එහි එකතු වටිනාකම රු.මිලියන** 83 **ක් විය.**

(ඈ) 2010 **දෙසැම්බර්** 31 **දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. මිලියන** 78,143 **ක් වූ ණයගැතියන්ගෙන් රු.මිලයන** 46,798 **ක් හෝ ණයගැතියන්ගෙන් සියයට හැටක් වර්ෂ** 1 **සිට වර්ෂ** 17 **දක්වා පැරණි ණයගැතියන් වේ. මෙම ණය අයකර ගැනීමේ හැකියාව සැක සහිත වුවද සංස්ථාව විසින් මෙම ණයගැතියන් සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි.**

(ඉ) **ලංකා ඉන්දියන් තෙල් සමාගමෙන් ලබා ගන්නා ලද තොග වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන** 14.2 **ක් නොපියවා** 2004 **වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ලැබීම් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාව** 2010 **දෙසැම්බර්** 31 **දින දක්වා මෙම මුදල නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.**

2.2.6 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

**අවශ්‍ය සාක්ෂි නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.**

(අ) **මුතුරාජවෙල ව්‍යාපෘතියට අදාලව කොන්ත්‍රාත්කරුගේ ගෙවීම්, සේවකයින්ගේ ආදායම් බදු, උපයන විට ගෙවීම් බදු** (PAYE TAX) **සහ වෙනත් ගෙවිය යුතු දෑ සඳහා ඉකුත් වර්ෂ වලදී කරන ලද රු.මිලියන** 479 **ක් වූ ප්‍රතිපාදනය නොකඩවා සෑම වර්ෂයකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් විස්තර විගණනයට ලැබී නොතිබුණි. තවද එම ප්‍රතිපාදනය ශ්‍රී.ලං.ගි.ප්‍ර.** 36- **ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා**

අසම්භාව්‍ය වත්කම්, ප්‍රමිතියෙහි අවශ්‍යතාවය අනුව ශේෂ පත්‍ර දිනට සමාලෝචනය කර නොතිබුණු අතර, ප්‍රවර්ථන ප්‍රශස්ථ ඇස්තමේන්තුව පිළිඹිබු වන ආකාරයට ගැලපීම් ද කර නොතිබුණි.

(ආ) සපුගස්කන්ද කුඩා පර්යන්තයට අයත් රු. මිලියන 67 ක් වටිනාකමැති ඉඩම් හතරක් සඳහා හිමිකම් ඔප්පු ඉදිරිපත් කිරීමට සංස්ථාව අසමත් වී තිබුණි.

(ඇ) මුතුරාජවෙල පිහිටි වටිනාකම රු.මිලියන 259 ක් වූ අක්කර විසිපහක ඉඩම වත්කමක් ලෙස ලෙජරයේ දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඉඩමේ අයිතිය ඔප්පු කිරීම සඳහා හිමිකම් ඔප්පු හෝ ලියවිලි කිසිවක් නොවීය.

(ඈ) දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති රු.මිලියන 126 ක් වූ වත්කම් 2002 දෙසැම්බර් 31 ට පෙර මිලදී ගෙන ඇති වත්කම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොවීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් වල අයිතිය, පැවැත්ම සහ සම්පූර්ණාත්වය නිශ්චය කිරීමට නොහැකි විය.

(ඉ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල ඇතුලත් රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන වලින් ලැබිය යුතු රු.මිලියන 8,096 ක් සම්බන්ධයෙන් සනාථ කිරීම් ලැබී නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එම ශේෂ වල සම්පූර්ණාත්වය පැවැත්ම සහ අයකර ගත හැකි බව පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඊ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ ඇතුලත්ව තිබුණු මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.මිලියන 714 ක් වූ දේශීය භාණ්ඩ බදු වල අයකර ගතහැකි බව තීරණය කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොවීය.

### 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනත | පනතේ නියම කර ඇති පරිදි, සේවය අවසන් කළ සේවකයකු සඳහා පාර්තෝෂික, දින 30 ක් ඇතුලත ගෙවා නොතිබුණි. තවද මෙවැනි ප්‍රමාද වී කරන ලද ගෙවීම් සඳහා සංස්ථාව විසින් අධිභාර ගෙවා නොතිබුණි.<br>මේ පිළිබඳව සභාපතිවරයා 2011 දෙසැම්බර් මස මා වෙත පහත පරිදි ප්‍රකාශ කරන ලදී.<br>පාර්තෝෂික දින 30 ක් ඇතුලත සේවකයන් |

| | | |
|---|---|---|
| | | කිහිප දෙනෙකුට නොගෙවීමට හෞතිකමය වශයෙන් හේතු වුයේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනයෙන් බැහැරවීම නිසාය. උදාහරණයක් ලෙස සමහර අවස්ථාවල මරණයට පත් සේවකයින්ගේ හිමිකාරත්වය ඉල්ලුම් කරන විවිධ පක්ෂවල නීතිමය හිමිකාරත්වය ලංකා ඛණිජ තෙල් සංස්ථාව පරීක්ෂා කළයුතු වේ. තවත් සමහර අවස්ථාවල මතභේදයට ලක්ව ඇති අතර ඒ සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් නිගමන වලට එනතුරු ගෙවීම් නතර කරන ලෙස කම්කරු කොමසාරිස් විසින් උපදෙස් දී ඇත. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | සේවකයින්ට ලැබුණු මුදල් නොවන ප්‍රතිලාභයන් වෙනුවෙන් සංස්ථාව විසින් උපයන විට ගෙවීම් බදු ගෙවා නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පිඑඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | |
| i | 3.2 ඡේදය | සංස්ථාවේ ප්‍රධාන විෂයය වන ඛණිජතෙල් ක්ෂේත්‍රයට සම්බන්ධ එක් සාමාජිකයෙකු හෝ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ නොවීය. |
| ii | 6.1 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වු කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| iii | 6.5 ඡේදය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් |

2007,2008,2009 හා 2010 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**මේ සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් මස සභාපතිවරයා විසින් මා වෙත පහත පරිදි ප්‍රකාශ කරන ලදි.**

පසුගිය වසර සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව පිළියෙල කල නමුත් ඉදිරි සුරැකුම් ගනුදෙනු ක්‍රියාවලියේ කරුණු පදනම් කරගෙන ප්‍රසිද්ධ නොකරන ලෙස නීතිපති විසින් උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත් 2007 වසර සඳහා වන වාර්ෂික ගිණුම් ප්‍රසිද්ධ කිරීම පිළිබඳ උපදෙස් 2010 අප්‍රේල් 19 දින ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබුණි. 2008 හා 2009 වර්ෂ සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පිළියෙල කර තිබූ නමුත් ඉහත හේතුව නිසා ප්‍රසිද්ධ නොකරන ලදී. 2008 හා 2009 වසර සඳහා වන වාර්ෂික වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට 2011.08.23 දින පැවති රැස්වීමේදී භාර දෙන ලදී.

ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් ක්‍රමය (ERP) ව්‍යාපෘතියට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතින් කරන ලද (manual) ක්‍රමයක සිට පරිගණක ගත කරන ලද ක්‍රමයකට සෘජුවම මාරු වීම නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එම පද්ධති නිසා පැන නැගුන ගැටළු විසඳීමට සිදුවී තිබුණි.

| | | |
|---|---|---|
| iv | 4.2.2 ඡේදය | සංස්ථාව විසින් 2010 මැයි, ජුනි සහ ඔක්තෝබර් මාස වල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. |
| v | 8.3.5 ඡේදය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව වෙන් කළ මෝටර් වාහන වලට හිමිකම් නොමැති නිලධාරීන් වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ සභාපතිවරයාගේ අනුමැතිය මත පමණක් |

| | | |
|---|---|---|
| | | මෝටර් වාහන වෙන් කර දී තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේදී පමණක් ඉන්ධන හා ගමන් වියදම් දීමනා ලෙස රු.මිලියන 1.8 ක් සංස්ථාවේ නිලධාරීන් 08 දෙනෙකුට ගෙවා තිබුණි.<br><br>එසේ වෙන් කරන ලද මෝටර් වාහන සඳහා ඉන්ධන සීමාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ සභාපතිවරයා විසින් හෝ තීරණය කර තිබුණි.<br><br>ඊට අමතරව නිවාස සහ කාර්යාලය අතර ගමන් කිරීම සඳහා තම පෞද්ගලික මෝටර් රථ යොදා ගන්නා ඇතැම් නිලධාරීන්ට මසකට ලීටර් 100-120 ක වටිනාකම ට ප්‍රතිපූරණයන් ඉල්ලුම් කිරීම සඳහා සභාපතිවරයා විසින් අනුමැතිය දී තිබුණි. |
| vi | 8.7 ඡේදය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව සංස්ථාව විසින් එහි අරමුදල් වලින් සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. 2000 සිට 2010 කාලපරිච්ඡේදය සඳහා සංස්ථාව විසින් එසේ ගෙවා තිබුණු උපයන විට ගෙවීම් බදු රු.මිලියන 155 ක් විය. ඊට අතිරේකව සංස්ථාව උපයන විට ගෙවීම් සඳහා බදු මත බදු ගෙවා තිබුණි. |
| (ඈ) | 1998 මාර්තු 18 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සේවක ණය සඳහා පොලී අනුපාතිකය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව සියයට 7.2 සිට සියයට 4.2 දක්වා අඩු කර තිබුණි. මෙම වෙනස නිසා සමාලෝචිත වර්ෂය සඳහා අඩුවෙන් අයකරගත් මුදල රු.මිලියන 37.3 ක් විය. |
| (ඉ) | 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුල්‍ය හා සැලසුම් අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරප්පාඩු තනතුරේ වැඩ ආවරණය මාස 03 කට සීමා වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයන් 05 දෙනෙක් මාස 12 |

සිට මාස 55 ක කාලපරිච්ඡේදයක් පුරප්පාඩු තනතුරුවල වැඩ ආවරණය කර තිබුණි.

| | | |
|---|---|---|
| (ඊ) | ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1990 පෙබරවාරි 19 දිනැති ලිපිය | නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉහළ ගාස්තු වලට පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවාවන් ලබා ගෙන තිබුණි. ඒ අනුව 2007, 2008, 2009 සහ 2010 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 5, රු.මිලියන 10, රු.මිලියන 5 සහ රු.මිලියන 3.5 ක් ගෙවා තිබුණි. |

2.2.8 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම කළ යුත්තේ සංස්ථාව විසින් උපදවන ලද ලාභයෙනි. කෙසේ වුවද, සංස්ථාව ලාභ ඉපයීමක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2008, 2009 සහ 2010 වර්ෂ වල පිළිවෙලින් රු. මිලියන 147 , රු. මිලියන 148 සහ රු.මිලියන 179 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

2010 දෙසැම්බර් 08 දින අංක 25/1104 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පමණක් ප්‍රසාද දීමනාව ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද පිරිපහදුවේ සේවකයන්ගේ ප්‍රසාද දීමනා ගණනය කිරීමේදී සියයට 15 ක් වූ විශේෂ දීමනා සහ පිරිපහදුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයට ගෙවන ලද වෘත්තීය දීමනා ඉහත අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට එරෙහිව යොදාගෙන තිබුණි.

(ආ) තාක්ෂණික ශ්‍රේණියේ සේවකයන් 204 ක් සඳහා රු.මිලියන 11 ක තාක්ෂණික දීමනා අනුමත කර තිබුණි. කෙසේ වුවද තාක්ෂණ ශ්‍රේණි නිලධාරීන් 154 ක් සඳහා රු. මිලියන 9.4 ක් අනුමත වුවද එය ඉක්මවා රු.මිලියන 4.6 ක් ගෙවා තිබුණි.

2.2.9 **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර ආයතනයකින් ලබාගත් සේවකයින් 676 දෙනෙකු පිරිපහදුවේ හා ආරක්ෂක අංශයේ සේවයේ යොදවා ඇති අතර ඒ සඳහා රු.මිලියන70.1 ක මුදලක් ආරක්ෂක

සේවා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා ඇත. මෙම ගෙවීමේ පිරිවැය සඵලතාව විගණනයට පැහැදිලි නොකෙරිණි.

(ආ) ගිවිසුම අනුව පිරිපහදු ව්‍යාපෘති දෙකක් සම්බන්ධයෙන් ඇවර කළ අලාභ වශයෙන් අයකර ගත යුතු රු.මිලියන 1.5 ක් කොන්ත්‍රාත් කරුවන්ට මුදල් ගෙවීමේදී අඩුකරගෙන නොතිබුණි.

(ඇ) සාමාන්‍යයෙන් නඩත්තු කටයුතු සඳහා වැඩ නැවැත්වීම පෙබරවාරි මසයේදී සිදුකරන අතර නඩත්තු කටයුතු සිදුකිරීමෙන් අනතුරුව පිරිපහදුවේ ප්‍රධාන ඇනහිටීම් නොමැතිව ඉදිරි වර්ෂ දෙකක් කරගෙන යාමට බලාපොරොත්තු වේ. සමාලෝචිත වර්ෂයේදී නඩත්තු කටයුතු සඳහා වැඩ නැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 291.9 ක් ගෙවා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී නඩත්තු කටයුතු නිම වීමෙන් පසුවත් පිරිපහදුවේ සමහර අංශ වල මෙහෙයුම් කටයුතු නතරවී තිබුණි.

(ඈ) 2004 වර්ෂයේ සිට කරන ලද නැව් වල නඩත්තු කටයුතු හදිසි අවදානම් සහ වෙනත් පහසුකම් පිළිබඳ තොරතුරු ඉල්ලා සංස්ථාවේ සභාපතිවරයා විසින් ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ සභාපති වෙත 2010 ජුලි 07 වන දින ලිපියක් යවා තිබු නමුත් 2010 ජුලි 12 දින දක්වා ඒවා ලැබී නොතිබුණි. සංස්ථාවේ තොරතුරු වල අඩුපාඩුකම නිසා වියදම් බෙදා ගැනීමට නොහැකි වී ඇති අතර මුළු වියදම සංස්ථාව විසින් පමණක් ඇතුලත් කර තිබුණි. මේ නිසා සංස්ථාවේ අලාභය ගණනය කිරීමට නොහැකි විය.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ වැඩ කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය බදු වලට පෙර රු. මිලියන 26,923 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ අලාභය රු. මිලියන 11,480 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.මිලියන 15,443 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

#### 3.1.2 මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ විශ්‍රහාත්මක සමාලෝචනය

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් කළමනාකරණයේ දුර්වල කාර්ය සාධනය පහත විශ්ලේෂණයෙන් දැක්වේ.

i. සමාලෝචිත වර්ෂය අවසානයේදී වාර 0.82 ක් වූ ද්‍රවශීලතා අනුපාතය රට අනුරූපව ඉකුත් වාර්ෂයේ වාර 1.06 න් වූ ද්‍රවශීලතා අනුපාතය සමග සැසඳීමේදි සුළු පහත වැටීමක් පෙන්නුම් කෙරුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ක්ෂණික අනුපාතය වාර 0.86 සිට වාර 0.56 දක්වා පිරිහී තිබුණි.

ii. ඉකුත් වර්ෂයේ වාර 3.9 ක් සමග සැසඳීමේදී ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 3.39 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේ දින 165 ක් වූ ණය රැස් කිරීමේ කාලපරිච්ඡේදය සමග සැසඳීමේදී එය දින 108 දක්වා අඩු වී තිබුණි.

iii. පෙර වර්ෂයේ දින 40 කට එරෙහිව තොග තබා ගැනීමේ කාල පරිච්ඡේදය දින 46 ක් වී තිබුණු බැවින් දින 06 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි.

iv. ඉකුත් වර්ෂයේ වාර 2.52 සමග සැසඳීමේදී ණයහිමි පිරිවැටුම් අනුපාතය වාර 2.3 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේ ණය ගෙවීම් කාලපරිච්ඡේදය දින 144 සමග සැසඳීමේදී එය දින 159 දක්වා වැඩි වී තිබුණි.

v. ඉකුත් වර්ෂයේ දින 20 සමග සැසඳීමේදි මෙහෙයුම් චක්‍රය දින 25 ක් වී තිබුණු බැවින් දින 05 කින් වැඩි වීමක් දැක්වුණි.

(ආ) 2009 වර්ෂයේ ණය සහ ප්‍රාග්ධන තත්ත්වය වූ 39: (14) සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදි 47:(40) දක්වා වැඩිවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ 0.92% සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ ආන්තිකය -3.62% දක්වා අඩු වී තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ඉපයුම් අනුපාතය 2009 සහ 2010 වර්ෂ වල ඍණ නැමියාවක් දැක්වුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ ඍණ 7.79% මුළු වත්කම් මත ඉපයුම් අනුපාතය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ඍණ 17.57% ක් විය.

(ඊ) ඉකුත් වර්ෂයේ ඍණ 1.8 ක් වූ පොලී ආවරණ අනුපාතය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ඍණ 209 ක් විය.

3.2 **මෙහෙයුම් සමාලෝචනය**

3.2.1 **කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලාෆ් ගෑස් (පෞද්ගලික ) සමාගම අතර එළඹි සම්පීඩිත දියර වායු විකුණුම් සම්බන්ධ ගිවිසුම අනුව 2006 ඔක්තෝබර් 20 දින අවසන් වී තිබුණි. කෙසේ වෙතත් සංස්ථාව ගිවිසුමකට එළඹීමෙන් තොරව අඛණ්ඩව සම්පීඩිත දියර වායු ලාෆ් ගැස් (පෞද්ගලික ) සමාගමට සපයා තිබුණි. ඒ වෙනුවට ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විසින් දෙන ලද ලිපියක් මගින් සම්පීඩිත දියර වායු සැපයීම දීර්ඝ කර තිබුණි. ඊට අමතරව සංස්ථාව විසින් ගිවිසුමකින් තොරව සම්පීඩිත දියර වායු ලිට්රෝ ගෑස් සමාගමට සපයා තිබුණි.

(ආ) සංස්ථාවේ ඇතැම් නිෂ්පාදන, නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් විකුණා තිබුණි. මෙම අලාභ සහිත නිෂ්පාදන වලින් විශාල ශුද්ධ අලාභයට සැලකිය යුතු ලෙස සහ සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ ඍණ ස්කන්ධ තත්ත්වයට දායක වන බව පෙනී යයි.

විස්තර පහත දැක්වේ.

| නිෂ්පාදිතය | විකුණුම් වටිනාකම රු.මිලියන | විකුණුම් පිරිවැය රු.මිලියන | දළ අලාභය රු. මිලියන | 2010 වර්ෂයේ අවසාන දිනට ශුද්ධ ලාභය |
|---|---|---|---|---|
| ඉන්ධන තෙල් 3500 (බලශක්තිය ) | 7,482 | 13,777 | (6,295) | 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය |
| ඉන්ධන තෙල් 1500 (බලශක්ති ) | 15,067 | 27,308 | (12,241) | සඳහා රු. මිලියන 26,923 ක ශුද්ධ |
| ඉන්ධන තෙල් (වෙනත්) | 6,313 | 9,446 | (3,133) | අලාභයක් ව අතර |
| කෘෂි රසායන | 153 | 184 | (31) | බලශක්ති උත්පාදන |
| සම්පීඩිත දියර වායු | 1,921 | 1,992 | (70) | ඉන්ධන තෙල් |
| භූමිතෙල් | 10,711 | 14,321 | (3,610) | රු. මිලියන 18,536 |
| නැප්තා | 4,229 | 4,456 | (228) | ක දළ අලාභයකට දායක වී තිබේ. |

3.2.2 **සංස්ථාවේ සම්පත් වෙනත් රජයේ ආයතන විසින් උපයෝජනය කිරීම.**

---

2003 ජුනි 02 දිනැති අංක පිරඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 පරිච්ඡේදයේ ඇතුලත් උපදෙස් නොසලකා සහ අදාල අනුමැතියකින් තොරව මෝටර් වාහන 11 ක් රාජ්‍ය ආයතන දෙකකට නිදහස් කර තිබුණු අතර සේවකයින් 18 දෙනෙකු රාජ්‍ය ආයතන 07 කට මුදාහැර තිබුණි. ඊට අමතරව පිරිපහදුවේ සේවකයන් 4 දෙනෙකු වලංගු හේතුවක් නොමැතිව වෙනත් රාජ්‍ය ආයතන වලට නිදහස් කර තිබූ අතර සංස්ථාවේ වෙනත් අංශයකට හෝ පිරිපහදුවට සේවයක් සලසා නොගෙන වැටුප් දීමනා සහ වෙනත් දීමනා ලෙස රු. මිලියන 4.1 ක් ගෙවා තිබුණි.

3.2.3 **හඳුනාගත් පාඩු**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනාගතයේදී නැව්තෙල් අලෙවිය පවත්වාගෙන යාමේ අදහස ඇතිව සංස්ථාව පෞද්ගලික සමාගමක් හරහා පිරවුම් ව්‍යාපාරයකට 2008 අප්‍රේල් මාසයේදී එළඹ තිබුණි. සංස්ථාවට අනුව, වෙළඳ පොලෙහි අනෙකුත් තරඟකරුවන් සමග තරඟ කිරීම සඳහා විවිධ උපායන් යොදා ගැනීමට සිදුවීම නිසා පිරවුම් ව්‍යාපාරය ආරම්භයේදී පැවැති වාතාවරණය සංස්ථාවට හිතකර නොවීය. එම නිසා 2008 අප්‍රේල් සිට 2008 දෙසැම්බර් දක්වා සහ 2009 ජනවාරි සිට 2009 මැයි දක්වා වූ කාලපරිච්ඡේදය වූ තුල සංස්ථාව එම පුද්ගලික සමාගමට අඩුකළ මිලකට ඉන්ධන විකුණා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පිරවුම් ව්‍යාපාරයෙන් සංස්ථාව පිළිවෙලින් රු. මිලියන 85.2 ක සහ රු. මිලියන 125 ක අලාභයන් (ආසන්න වශයෙන් ) දරා තිබුණි. කෙසේ වුවද සංස්ථාව 2009 අප්‍රේල් සිට නැව්තෙල් අලෙවියට සම්බන්ධ නොවී තිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 38,086.32 ක ආසන්න වශයෙන් රු. මිලියන 4.2 ක තොගයක් ජයා කන්ටේනර් ටර්මිනල් ඔයිල් බෑන්ක් වල තොග ලෙස පැවතුණි. ඊට අමතරව, ජයා කන්ටේනර් ටර්මිනල් ඔයිල් බෑන්ක් වල ගබඩා කර ඇති ඉන්ධන මෙට්‍රික් ටොන් 75.38 ක් වෙනුවෙන් වූ ගබඩා කිරීමේ ගාස්තු රු.මිලියන 0.84 ක් 2009 ජුනි සිට ගෙවා නොතිබුණි.

(ආ) වර්තමාන පරිචය සහ සීමාසහිත ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සමග එකඟ වූ නියමයන් හා කොන්දේසි වලට අනුව බෙදුම්කරුවන්ගෙන් ප්‍රවාහන ගාස්තු ලෙස එකතු කරගත් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් සීමාසහිත ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගමට (CPSTL) ප්‍රතිපූරණය කර තිබුණි. ප්‍රවාහන ගාස්තු ද ඇතුළත් බැහැර කිරීම් මත පදනම් ව සංස්ථාව බෙදුම්කරුවන්ගේ කොමිස් ගණනය කර තිබුණි. සීමාසහිත ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් පිළියෙල කරන

ලද සත්‍ය මාසික පාරිභෝජන වාර්තාව පදනම් කරගෙන එම සමාගමට ගෙවන ප්‍රවාහන ගාස්තු (slab) ගණනය කර තිබුණි. මෙම පරිචය හේතුවෙන් සංස්ථාවට 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්ෂය සඳහා ආසන්න වශයෙන් රු.මිලියන 5.6 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඈ) බවුසර සහ වැගන් මගින් ඉන්ධන සැපයීමේදී හා ඩිපෝ සහ පර්යන්ත ගබඩා වල ඉඩදෙන මෙහෙයුම් පාඩු සඳහා සම්මත නියමයක් නොමැති විය. සංස්ථාව විසින් අනුගමනය කරන පරිචය අනුව තම භාවිතය සහ ක්‍රියාවලි පාඩු බොර තෙල් යෙදවුම් වලින් 5% සංඛ්‍යාවකට ඉඩදීම සහ ස්ථාන දෙකක් අතර සෑම ප්‍රවාහනයකදීම වාෂ්ප වීම සඳහා 0.5% කට ඉඩදීම වේ. කෙසේ වුවද, 2009 වර්ෂය තුල වාෂ්ප වීම් ක්‍රියාවලින්, මෙහෙයුම් සහ තොග පරිහරණය කිරීම් නිෂ්පාදන මාරු කිරීමේ යනාදියට අදාළව රු. මිලියන 886 ක පාඩුවක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ආනයනය කළ ඉන්ධන සඳහා සංස්ථාව වෙනුවෙන් 2008 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 1,273.6 ක් (ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 11.5) ගෙවා තිබු අතර මහා භාණ්ඩාගාරයට අයිරා පොළිය ලෙස අයවිය යුතු රු. මිලියන 65.9 ක් රජයේ ණය වලට හිලව් කර තිබුණි. මහා භාණ්ඩාගාරය විසින් අත්තිකාරම් මුදල් නොගෙවීම නිසා සංස්ථාවට රු. මිලියන 65.9ක අලාභයක් සිදුවී තිබුණි.

### 3.2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පවතින පද්ධතියේ අවධානම පිළිබඳ විධිමත් ඇගයීමකින් තොරව ව්‍යවසායකයන්ට සම්පත් සැලසුම් ක්‍රමයකට සම්බන්ධ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර තිබුණි. මෙම ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් ක්‍රමය ඉන්දියන් තෙල් සමාගමේ (සංස්ථා ප්‍රධාන තරඟකරුවකුගේ මව් සමාගම ) සහය ඇතිව වැඩි දියුණු කිරීම සඳහා සීමාසහිත ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගම කටයුතු කර තිබුණි. සංස්ථාව විසින් සැලකිය යුතු ප්‍රමාණයක මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් යොදවන බැවින් මේ පිළිබඳ ක්ෂේත්‍රයේ සිටින විශේෂඥයන්ගේ සහාය ලබා ගැනීමකින් තොරව හා එහි බලපෑම පිළිබඳව විධිමත් හා ගැඹුරු අධ්‍යනයකින් තොරව සංස්ථාව විසින් ආයතනික සම්පත් පද්ධතිය ඒකාබද්ධ කිරීමට කටයුතු කර තිබුණි. තවද සීමාසහිත ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගම හා ලංකා ඉන්දියන් තෙල් සමාගම් වල විශේෂිත වූ වගකීම් වලට අදාල අවබෝධතා ගිවිසුමක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ඇති කරගෙන නොතිබුණි. සීමාසහිත ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගම හඳුන්වා දෙනු ලැබූ ව්‍යවසායකයන්ට සංවර්ධන ව්‍යාපෘතියට සංස්ථාවට සැලකිය යුතු මට්ටමක වියදමක් හා මානව සම්පත් ප්‍රමාණයක් වැය කරන හෙයින් ඒ

පිළිබඳ පූර්ව උපක්‍රමයක් ලෙස ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන නොතිබුණි.

(ආ) සංස්ථාවේ මුතුරාජවෙල ටැංකි අංගනයේ අංක 4 සී, 1 ඩී, සහ 1 ඒ වරායන් වල තාක්ෂණික දුර්වලතා හේතුවෙන් ක්‍රියාත්මක නොවිය. කෙසේ වෙතත්, සංස්ථාව විසින් වරායන් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ණයවර ලිපි පිළියෙල කිරීමේ ප්‍රමාදය නිසා සංස්ථාව රු. මිලියන 20.3 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

(ඈ) සංස්ථාව විවිධ කොටස් කළඹවල වල රු. මිලියන 2,556 ක විශාල ආයෝජනයන් සිදු කර තිබුණි. කෙසේ වෙතත් 2010 දෙසැම්බර් 31 දිනට මෙම ආයෝජන වලින් ආදායම් උත්පාදනය කර නොතිබුණි.

(ඉ) 2006 අගෝස්තු 8 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හා 2008 මාර්තු 24 දිනැති නයෝජ්‍ය මුල්‍ය කළමනාකරුගේ (ආදායම් ) සංශෝධිත ලිපිය අනුව ගනුදෙනුකරුවන්ගේ හිඟ අයවිය යුතු ශේෂයන් සඳහා වාර්ෂිකව සියයට 24 ක පොළියක් අයකළ යුතු වේ. ගුවන් සේවා ගනුදෙනුකරුවන්ගෙන් සහ පෞද්ගලික ගනුදෙනුකරුවන්ගෙන් පිළිවෙලින් පොළිය ලෙස අයකර ගතයුතු රු. මිලියන 1.2 ක් සහ රු. මිලියන 1.1 ක් අයකර ගෙන නොතිබූ බව විගණන නියැඳි පරීක්ෂාවේදී හෙලිදරව් විය.

(ඊ) සංස්ථාව විසින් ආනයනය කර තිබුණු රු. මිලියන 1,140 ක් වටිනා 1500 අඩි ගෙන්දගම් ඉන්ධන තෙල් මෙට්‍රික් ටොන් 20,000 ක් නරක් වී තිබුණ අතර එය දිවයිනේ ස්වාධීන බල නිපදවන්නන්ට බලපා තිබෙන බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් සංස්ථාව විසින් නීතිපති විමසා තිබේ. ඉහත තත්ත්වය අනුව 1500 අඩි ගෙන්දගම් ඉන්ධන තෙල් ආනයනය කිරීම සඳහා වූ ඉන්ධන පිරිවිතරයක් සහ එළඹී ඇති ටෙන්ඩර් කොන්දේසි සංස්ථාවට වාසිදායක නොවූ හෙයින් සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මුදල් නාස්තියක් බව නීතිපතිවරයාගේ අදහස විය. මෙනිසා එම සැපයුම්කරුගේ ලියාපදිංචිය අහෝසි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. මෙනිසා සංස්ථාව විසින් ගිවිසුම්වලට එළඹීමේ කොන්දේසි සංස්ථාවට හිතකර නොවූ බව නිරීක්ෂණය විය.

(උ) චීන වරාය යන්ත්‍ර අංගනයේ අයිතිය පවරා ගැනීමට සහ එයට සම්බන්ධිත කරුණු වලට අදාලව ලංකා ඉන්දියානු තෙල් සමාගම සමග ශ්‍රී ලංකා රජය සහ සංස්ථාව 2003 දී එළඹුණු ගිවිසුමට අනුව, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉන්දියානු තෙල් සමාගමට කල් බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණු අතර එම ගිවිසුමට එළඹී දන සිට මාස 06 ක් ඇතුලත එම ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, සංස්ථාව කිසිදු කල් බදු ගිවිසුමකට මෙතෙක් එළඹී නොමැති අතර 2003

පෙබරවාරි මාසයේ සිටම ලංකා ඉන්දියානු තෙල් සමාගම ගබඩා පහසුකම් භාවිතා කර තිබුණ නමුත් එම සමාගමෙන් රට අදාල කිසිදු කල් බදු කුලියක් ලැබී නොතිබුණි.

**මේ සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් මස සභාපතිවරයා විසින් මා වෙත පහත පරිදි ප්‍රකාශ කරන ලදී.**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට වීන වරාය ඉඩම සම්බන්ධව ඉන්දියානු තෙල් සමාගම සමග කල් බදු ගිවිසුමකට එළඹීමට ඒ පිළිබඳව අයිතියක් නැත. කෙසේ වෙතත් ඉඩම් දෙපාර්තමේන්තුව හා අනෙකුත් රජයේ නියෝජිත ආයතන සමග පැවැත්වූ කතිකාවත් මාලාවකින් පසු ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් සමග සම්බන්ධ වී ලිපි ගොනු ඉදිරිපත් කිරීමෙන් පසු දිගු කාලීන කල් බදු පහසුකම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ලබා දීමට එකඟ වී ඇත. කල් බදු පහසුකම ලැබුණු පසු ගැසට් නිවේදනයේ පරිදි ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් පාවිච්චි කරන ඉඩම සඳහා අතුරු බදු ලබා දිය හැකිය.

(ඌ) **තොග භෞතික සන්නිරීක්ෂණය**

------------------------------------

සංස්ථාව 2010 දෙසැම්බර් 31 දින සහ 2011 ජනවාරි 01 දින තොග භෞතික සන්නිරීක්ෂණ පවත්වා තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. ගණන් කිරීමේ පත්‍රිකා 87 න් ඉන්ධන ලීටර් 172,165,422 ක් ඇතුලත් ගණන් කිරීමේ පත්‍රිකා 13 ක් ඩිපෝ කළමනාකරු විසින් අත්සන් කර තහවුරු කර නොතිබුණි.

ii. සංස්ථාවේ හා ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ ඉන්ධන තොග කොලොන්නාවේ එකම පර්යන්තයක නඩත්තු කර තිබුණි. මෙම හේතු නිසා පහත සඳහන් අවදානම් හඳුනා ගැනේ.

- සංස්ථාවේ භෞතික ඉන්වෙන්ට්‍රි ශේෂය වෙනම ගණනය කිරීමට නොහැකි වීම.
- සංස්ථාව සහ සමාගම විසින් ආනයනික නිෂ්පාදන එකම ටැංකියක ගබඩා කර තිබූ අතර වෙනස් ගුණයන්ගෙන් යුක්ත නිෂ්පාදන දෙකක් කළවම් වීම නිසා එක් එක් ආයතනයේ ශේෂයන් හඳුනා ගැනීම අපහසු වීමට මෙය බලපා ඇත.
- භෞතික තොග සත්‍යක්ෂණ කණ්ඩායමට නම්කළ සමහර නිලධාරීන් භෞතික තොග සංත්‍යක්ෂණයට පූර්ව අනුමැතියක් තොරව සහභාගි වී නොතිබුණි. සහභාගි නොවූ තෝරාගත් නිලධාරීන් වෙනුවට පත්කළ නිලධාරීන්ගේ ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

මේ නිසා සංස්ථාව මෙම කාර්යයන් සම්බන්ධයෙන් ආරක්ෂා වීම පිණිස අවධානය යොමු කර නොමැති බව පෙනේ.

3.2.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

**අතරමැදි නිෂ්පාදනයන් බොරතෙල් වටිනාකමට අගය කර තිබූ අතර අතරමැදි නිෂ්පාදනයන් අගය කරීම සඳහා යෝග්‍ය පිරිවැය ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි.**

3.2.6 **ප්‍රසම්පාදනය**

-----------------

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) **ලංසු අවසන් වේලාවට පසුව ලැබූ ලංසු ඉල්ලුම්පත්‍ර පිළිගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මග පෙන්වීම්** 6.3.2 **හි ප්‍රතිපාදනයට එරෙහිව මෙම ලංසු, ලංසු විවෘත කිරීමේ කොමිටිය මගින් විමර්ෂණය කර තිබූ අතර තවදුරටත් බොහෝ අවස්ථා වල ලංසු තබන්නන්ට ප්‍රමාද ලංසු තැබීමට ඉඩ දී තිබුණි.**

(ආ) **බොරතෙල් ආනයනයේදී වූ නැව් ප්‍රමාද ගාස්තු සහ වටිනාකම රු.මිලියන** 78.4 **ක් ඉන්ධන තොග** 2010 **දෙසැම්බර්** 31 **දිනට වර්ෂ එකේ සිට වර්ෂ නවය දක්වා වූ කාල පරාසයක් තුල නොපියවා රඳවා ගෙන තිබුණි.**

(ඇ) 1996 **සිට** 2008 **දක්වා වර්ෂයන් තුල අවස්ථා**16 **කදී අපනයන බොරතෙල් සහ ඉන්ධන තොග සම්බන්ධයෙන් නැව් අයිතිකරුවන්ගෙන් අය කර ගත යුතු අලාභ** (Outturn losses) **සහ නැව් ප්‍රමාද ගාස්තු වූ රු.මිලියන** 37.7 **ක් අයකරගෙන නොතිබූ අතර** 2010 **වර්ෂයේ නැව් දඩමුදල් වූ රු.මිලියන** 1.1 **ක්** 2010 **දෙසැම්බර්** 31**දින දක්වා අයකරගෙන නොතිබුණි.**

(ඈ) 2010 **වර්ෂය තුල** BK/30/2010 **යටතේ ආනයනය කරන ලද වටිනාකම රු. මිලියන** 1,025.6 **ක් වූ නිෂ්පාදන අපවිත්‍ර වී තිබූ අතර රට අමතරව සංස්ථාව විසින් රු. මිලියන** 0.4 **ක් නිෂ්පාදන පරිහරණය කිරීමේ ගාස්තු ලෙස ලංකා ඛණිජතෙල් ගබඩා පර්යන්ත සමාගමට ගෙවා තිබුණි.**

### 3.2.7 වත්කම් කළමනාකරණය

පහත දැක්වෙන වත්කම් ඒවා අත්කරගත් දිනයේ සිටම නිෂ්ක්‍රියව තිබෙන්නට ඉඩ හැර තිබුණි.

| වත්කමේ ස්වභාවය | අදහස් දැක්වීම් |
| --- | --- |
| (අ) වනාතමුල්ල - හල්ගහකුඹුර ඉඩම | මෙම ඉඩම යෝජිත සම්පීඩිත දියර වායු ව්‍යාපෘතිය සහ ක්‍රිඩා භූමියක් සඳහා රු.මිලියන 10.6 කට අත්කර ගෙන තිබුණි. කෙසේ වුවද, අනවසර පැහැර ගැනීම් හේතුවෙන් මෙය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද 1973 සිට මෙම ඉඩමේ නීති විරෝධි ලෙස අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටි අතර වර්තමානයේ එම ඉඩමේ පවුල් 623 ක් පමණ පදිංචි වී ඇති බව නිරීක්ෂණය විය. |
| (ආ) මහහේන ඉඩම | ලබාගත හැකි වූ ලියවිලි අනුව සංස්ථාව විසින් ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 0.625 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම ඉඩම සංස්ථාවේ පොත් වල ගිණුම්ගත කර නොතිබූ අතර 1986 සිට මෙම ඉඩම පෙර අයිතිකරු විසින් භාවිතා කෙරේ. |

### 3.2.8 මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමහර පෞද්ගලික ලිපිගොනු වල සේවකයින්ගේ කාර්යය විස්තර ඇතුලත් කර නොතිබූ අතර පෞද්ගලික ලිපිගොනු වල ලේඛන පිළිවෙල අනුව අංක කර නොතිබුණි. හදිසි නිවැරදි කිරීමෙන් මේවා බරපතල අඩුපාඩු ලෙස නිරීක්ෂණය විය.

(ආ) වාර්ෂික අතිකාල අයවැය සැලකිල්ලට ගෙන සේවකයන්ට අතිකාල වැඩ පැය පවරා තිබූ අතර අතිකාල වැඩ පැවරීමට පෙර අවශ්‍යතාවය සහ නිෂ්චය කිරීම පිළිබඳ ඇගයීමක් කර නොතිබුණි.

3.2.9 **දෘශ්‍ය අක්‍රමිකතා/අවිධිමත් ගනුදෙනු**

---------------------------------------

මාගේ පසුගිය විගණන වාර්තා වල සඳහන් කර ඇති පරිදි සේවක සුබසාධක සංගමයක් (ලංකා ඛනිජ තෙල් සංස්ථා සකසුරුවම් සමිතිය ) සංස්ථාව විසින් කලින් කලට කරනු ලබන ගෙවීම් මගින් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංස්ථාව විසින්ම ක්‍රියාත්මක කළ හැකිව තිබුණු සංස්ථාවේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 40.57 ක් සමිතියට මුදාහැර තිබුණි. බාහිර ප්‍රතිකාර සඳහා මාසික වැටුප සමග එක් සේවකයෙකුට වර්ෂයකට රු. 3,000 බැගින් ගෙවන වෛද්‍ය දීමනාවට අමතර වශයෙන් ඉහත සඳහන් දායක මුදල සමිතියට ගෙවා තිබුණි.

(ii) සංස්ථා අරමුදල් වලින් සමිති සාමාජිකයින්ට සංස්ථාව විසින් දෙන ලද ණය වලින් 2010 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති හිඟ ශේෂය රු. මිලියන 151.7 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පොලී ආදායම ලෙස රු. මිලියන 3.4 ක් ලැබී තිබුණි.

3.2.10 **සංයුක්ත සැලැස්ම**

----------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. එසේම එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර එය අමාත්‍යාංශයට , රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. 2007-2011 සහ 2009-2013 කාලපරිච්ඡේද වලට අදාල සංයුක්ත සැලසුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.2.11 **අයවැය**

---------

සමාලෝචිත වර්ෂයේදී අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් අනාවරණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලන**

---------------------

**විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින් වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.**

(අ) දේපල, පිරියත හා උපකරණ

(ආ) ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ

(ඇ) වෙළඳ ණයහිමියෝ සහ වෙනත් ගෙවිය යුතු දෑ

(ඈ) ඉදිරි රැකුම් ගනුදෙනු

(ඉ) බදුකරණය

(ඊ) ගිණුම්කරණය

(උ) නීති, රීති, ආදියට අනුකූලවීම

(ඌ) ආයෝජන

(එ) තොග

(ඒ) සම්පත් උපයෝජනය

(ඔ) මානව සම්පත් කළමනාකරණය

(ඕ) වත්කම් කළමනාකරණය

(ක) ගනුදෙනු පිළිබඳ අධිකාරිය

(ග) සංයුක්ත සැලැස්ම

(ට) අයවැය

**එච්.ඒ.එස්.සමරවීර**
**විගණකාධිපති**

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| Avn | - | ගුවන්තෙල් අංශය |
| Bbl | - | බැරලය (ජාත්‍යන්තර ඛනිජ තෙල් විකිණීමේ ඒකකය) |
| bps | - | සාමාන්‍ය ලකුණු |
| BTR | - | තොග චලනය |
| CEB | - | ලංකා විදුලිබල මණ්ඩලය |
| CIF | - | පිරිවැය රක්ෂණ හා නැව් ගාස්තු |
| CPC | - | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| CPSTL | - | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම |
| EPF | - | සේවක අර්ථසාධක අරමුදල |
| FIFO | - | ප්‍රථම ලැබීම් හා ප්‍රථම නිකුත් කිරීම් |
| FOB | - | නැවතෙක් නොමිලේ |
| FOREX | - | විනිමය අනුපාතය |
| GOSL | - | ශ්‍රී ලංකා අණ්ඩුව |
| ICPA | - | ජාත්‍යන්තර සමුපකාර ඛනිජ තෙල් සංගමය |
| Int | - | පොලිය |
| LIOC | - | ලංකා ඉන්දියානු තෙල් සමාගම |
| LMS | - | ලංකා මැරයින් සමාගම |
| LPG | - | සම්පීඩිත දියර වායු |
| Ltr | - | ලීටරය |
| MOU | - | අවබෝධතා ගිවිසුම |
| NDB | - | ජාතික සංවර්ධන බැංකුව |
| NSL | - | ජාතික ආරක්ෂක බද්ද |
| OPEC | - | තෙල් නිෂ්පාදනය හා ආපනයනය කරන රටවල් සංවිධානය |
| SPBM | - | ඒකස්ථාන පාවෙන බෝයාව |
| TT | - | පිරිවැටුම් බදු |
| VAT | - | වටිනාකම් එකතුකළ අගය මත බද්ද |

මුද්‍රණය: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව